ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
காணி சீர்திருத்த ஆணைக்குழு
Land Reform Commission

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை வளங்கள், காணிமறறும் நீர்ப்பாசனஅமைச்சு
Ministry of Agriculture, Livestock, Land and Irrigation

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report

2024

011 2 144 795 FAX 011 2 878 052
www.lrc.gov.lk අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල chairman@lrc.gov.lk

සභාපතිතුමාගේ පණිවුඩය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා මඟින් ස්ථාපනය කරනු ලැබූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, පනතේ විධි විධාන සහ රජයන් විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කරමින් රටේ සංවර්ධනය උදෙසා වසර 50 කට වැඩි කාලයක් තිස්සේ මහඟු දායකත්වයක් ලබාදී ඇත.

ඉහත පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් සහ භෞතික සම්පත් මනාව කළමනාකරණය කරමින් ජනතාවගේ සහ මාතෘ භූමියේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමේ වගකීම දරන ප්‍රමුඛතම ආයතනයක් ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හැඳින්විය හැක.

මේ අනුව, ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පවරාගත් ඉඩම්වල හිමිකරුවන්ගේ ව්‍යවස්ථාපිත බැඳීම් නිදහස් කිරීම සහ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය අවසන් කිරීම, කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම්වල ඵලදායීතාවය වැඩිදියුණු කිරීම, ඉඩම් සහ භෞතික සම්පත්වල හිමිකාරීත්වය කළමනාකරණය කිරීම සහ ඒවායේ ආරක්ෂාව සහතික කිරීම සහ ඵලදායී ආර්ථික ක්ෂේත්‍රවල ප්‍රයෝජනය සඳහා අවශ්‍ය විය හැකි ඉඩම් සංචිතයක් පවත්වාගෙන යාම කොමිෂන් සභාවේ ප්‍රමුඛතම කාර්යයන් වේ.

කොමිෂන් සභාව සතු ඉඩම්වල දීර්ඝ කාලයක් තිස්සේ කෘෂිකාර්මික කටයුතු සිදුකරමින් පදිංචි වී සිටින මහ පොළවේ කිසිදු හිමිකමක් නොමැති ජනතාවට ඉඩමක හිමිකම ලබාදෙමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට අප විසින් මහත් කාර්ය භාරයක් සිදුකරනු ලබයි. එමෙන්ම, කෘෂිකාර්මික කටයුතු හා රටේ දියුණුවට උපකාරී වන විවිධ ආයෝජන සඳහා කොමිෂන් සභාව සතු ඉඩම් බදු පදනම යටතේ ලබාදෙමින් රජයේ බදු ආදායමට මහත් රුකුලක් ලබාදෙන අතරම, නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අප විසින් සක්‍රීය දායකත්වයක් රට වෙනුවෙන් ලබාදෙන බවද මෙහිලා සඳහන් කළ යුතුය.

ඉහත දක්වා ඇති කාර්යයන් තවදුරටත් අඛණ්ඩව සිදුකරගෙන යාමට සහ නව රජයේ ප්‍රතිපත්තිවලට ගැළපෙන පරිදි කොමිෂන් සභාව සතු ඉඩම් සහ වත්කම් ඵලදායී ආයෝජනයන් සඳහා යෙදවීමට අමතරව කොමිෂන් සභාවට ලැබෙන ආදායම ඉහළ නැංවීම, පවතින ඉඩම් සම්පත ආරක්ෂා කරගැනීම සහ ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබාදීම සහ ඔවුන්ගේ සුභසාධනය සිදුකිරීම අරමුණු කරගෙන අවශ්‍ය ඉලක්කයන් සපුරා ගැනීමට සැලසුම් කරන ලද "වාර්ෂික වාර්තාව - 2024" මේ සමඟ ඉදිරිපත් කරමි.

ආර්. කේ. නිහාල්
සභාපති | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

පටුන

1.	ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1
1.1	හැඳින්වීම	1
1.2	දැක්ම, මෙහෙවර සහ අරමුණු	2
1.2.1	දැක්ම	2
1.2.2	මෙහෙවර	2
1.2.3	අරමුණු	2
1.3	කාර්යභාරය, ආයතන ස්ථාපනය, කොමිෂන් සභාවේ සංයුතිය සහ නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්	2
1.3.1	කාර්යයන්	2
1.3.2	ආයතනය ස්ථාපනය	3
1.3.3	කොමිෂන් සභාවේ සංයුතිය	3
1.3.4	නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්	3
1.4	සංවිධාන සැලැස්ම	4
1.5	අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල	5
1.5.1	ප්‍රධාන අංශයන්	5
1.5.2	දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල	5-6
2.	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	7
2.1	කළමනාකරණ හා මානව සම්පත් සංවර්ධන අංශය	7
2.1.1	ආයතනික කටයුතු	7
2.2	ඉඩම් අංශය	8
2.2.1	ඉඩම් පැවරීම් අංශය	8
2.2.2.	ව්‍යාපෘති අංශය	8
2.2.3	ඉඩම් උපරිම සීමා අංශය	9
2.2.4	රාජ්‍ය ආයතන අංශය	9
2.3	නීති අංශය	10
2.4	අභ්‍යන්තර විගණක අංශය	10
2.4.1	විගණනය සඳහා බලය	10
2.4.2	වසර තුල ඉටු කරන ලද රාජකාරී	11
3.	2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය	12
3.1	ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම.	12
3.1.1	ආයතනික තොරතුරු	12
3.1.2	සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති	13-20
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	21
3.3	විස්තීරණ ආදායම් ප්‍රකාශනය	23
3.4	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	24-25
3.5	ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය	26
3.6	මුදල් නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	27
4.	විගණකාධිපතිවරයාගේ වාර්තාව	28
5.	කාර්ය සාධන දර්ශක	29
5.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)	29
6.	තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය	30
6.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	30
7.	මානව සම්පත් පැතිකඩ	31
7.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	31
7.2	මානව සම්පත් සංවර්ධනය	32
8.	අනුකූලතා වාර්තාව	33-40

1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1975 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත, 1981 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත, 1981 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත, 1986 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත සහ 1986 අංක 18 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත වන පනත් මඟින් සංශෝධනය වූ 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ස්ථාපිත වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අඩ සියවසක් ඉක්මවා යන ඉතිහාසයකට හිමිකම් කියනු ලැබේ.

අවුරුදු 50 ක් පුරා කොමිෂන් සභාවේ කාර්යභාරය ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙන් ලැබී තිබූ ප්‍රතිපාදන මෙන්ම, රජය විසින් වරින්වර ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් මත මෙහෙයවමින් පවතී. ඉඩම් පවරා දුන් ප්‍රකාශකයින්ගේ නීතිමය බැඳීම් ලබාදීම මෙන්ම ඔවුනට වන්දි මුදල් ගෙවීම, පවරාගත් ඉඩම් ඵලදායි ආයෝජන වලට යෙදවීම කොමිෂන් සභාවට ලැබිය යුතු ආදායම රැස්කිරීම හා ඉඩම් ආරක්ෂා කිරීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රමුඛ කාර්යයන් වේ.

එසේම, වර්තමාන ශ්‍රී ලංකික ආර්ථික ගමන් මඟ සාර්ථක කරමින්, රජයේ අරමුණු හා ප්‍රතිපත්ති අනුව ඉඩම් කැබලි වැඩි ප්‍රමාණයක් මහජනයා අතරේ බෙදාදීමේ වැඩපිළිවෙල යටතේ, එකී කටයුතු සාර්ථක කර ගැනීම ඉලක්ක කර ගනිමින් කොමිෂන් සභාවේ කටයුතු මෙහෙයවීම අරමුණු කොට ඇත.

2024 වසර තුළ පහත සඳහන් ප්‍රමුඛතාවයන් විශේෂයෙන්ම හඳුනා ගැනීමට කටයුතු කර ඇත.

i. කොමිෂන් සභාව සතු ඉඩම් සිතියම් ගත කිරීම, මැනුම් කිරීම සහ තක්සේරු කිරීම මඟින් ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීම.
ii. ඵලදායි නොවන ආයෝජන වලට පවරන ලද ඉඩම් ආපසු ලබා ගැනීම
iii. "සැමට හිමි බිමක්" වැඩපිළිවෙල යටතේ කොමිෂන් සභාව සතු බෙදාදිය හැකි ඉඩම් බෙදාදීමට කඩිනම් වැඩපිළිවෙළක් සකස් කිරීම මෙන්ම මෙතෙක් බෙදා දී තිබූ ඉඩම් සඳහා පදිංචිකරුවන් නියමානුකූල කිරීමේ වැඩසටහන නව මුහුණුවරක් දී ජාතික කර්තව්‍යයක් ලෙස ඉඩම් ඔප්පු බෙදාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කරවීම
iv. ආදායම් වැඩිකිරීමේ වැඩසටහන්
   අ) කෘෂිකාර්මික හා කාර්මික ව්‍යාපෘතියන් සඳහා ලබාදී ඇති බදු ඉඩම් වලින් බදු මුදල් නිසි පරිදි අයකර ගැනීම.
   ආ) රජය විසින් අත්කර ගත් ඉඩම් සඳහා වන්දි මුදල් ලබා ගැනීම
   ඇ) රාජ්‍ය ආයතන වලට පවරන ලද ඉඩම් වෙනුවෙන් ආදායම් ලබා ගැනීම
   ඉ) බදු පදනම මත පුද්ගලයන්ට පවරන ලද ඉඩම් සඳහා මෙතෙක් අයකර ගැනීමට නොහැකි වූ බදු මුදල් අයකර ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම
   උ) ඛණිජ සම්පත් ආශ්‍රිත ආර්ථික ව්‍යාපෘති වලින් ආදායම් රැස්කිරීම

ආයතනයේ මෙම කාර්යභාරය පිළිබඳ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම හා නිලධාරින්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා ආයතනයේ සියළුම නිලධාරීන්ගෙන් සමන්විත එක් එක් කාර්යයන් සඳහා කමිටු පත්කිරීම හා වැඩමුළු පැවැත්වීම ද ආරම්භ කරන ලදී. එමෙන්ම කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදුකරන ලදී.

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත හා රජයේ ප්‍රතිපත්තිවලට අදාළව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්යභාරය මෙහෙයවීම හා කඩිනමින් ක්‍රියාත්මක කරවීම සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා අවශ්‍ය තීරණ හා එකී තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසුවිපරම් කිරීමද සිදුකරමින් පවතී. තවද, මහජනයාගේ විවිධ ගැටළු සම්බන්ධයෙන් ඔවුන් කැඳවා පත්කල කමිටු මඟින් ඍජු සාකච්ඡාවන් පවත්වා කඩිනම් තීරණ ගැනීම ද සිදු වී ඇත.

මීට අමතරව ඵලදායි ආයෝජන හඳුනාගෙන ඒ සඳහා ඉඩම් ලබාදීමට ගරු ඇමතිතුමාගේ උපදෙස් මත විශේෂඥ දැනුම ඇති උපදේශක කමිටු නිර්දේශය මත ක්‍රියා කිරීම ද සිදු කරමින් පවතී.

තවද, ගරු ඉඩම් අමාත්‍යතුමන්ගේ සහ අමාත්‍යාංශ ලේකම්තුමන්ගේ මෙහෙයවීම උපදෙස් සහ මඟ පෙන්වීම මත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙතින් පවරා ගත් ඉඩම් සම්පත උපයෝජනය මඟින් ආයතනයේ ප්‍රගතිය මෙන්ම රටේ ආර්ථික හා සමාජ සංවර්ධනයට විශාල දායකත්වයක් ලබාදී ඇත.

1.2 දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1 දැක්ම

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පැවරුණු ඉඩම් සහ භෞතික සම්පත් ජනතාවගේ සහ දේශයේ සමෘද්ධිය උදෙසා මෙහෙයවීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත්කිරීම.

1.2.2 මෙහෙවර

ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ උපරිමයට වැඩි ඉඩම් ජාතියේ යහපත උදෙසා ඵලදායිතාවය ඉහළ නංවමින් ද භෞතික සම්පතෙහි අයිතිය සුරක්ෂිත කොට පාලනය කරමින් ද, ඉඩම් උපරිමය කලානුරූපව බලාත්මක කරමින් ද, නියමානුකූලව වන්දි ගෙවීම හා ආර්ථික කටයුතු වල ආයෝජනය කරමින් ද, අනාගත පරපුරේ අභිවෘද්ධිය උදෙසා භාවිතා කල හැකි ඉඩම් සංචිතයක් පවත්වා ගෙන යමින් ජාතික සංවර්ධනයට ක්‍රියාකාරි ලෙස දායක වීම.

1.2.3 අරමුණු

i. උපරිමයට වැඩි කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක් කිසිම තැනැත්තකු විසින් අයිතිව තබා නොගැනීම සුරක්ෂිත කිරීම

සහ

ii. යම් තැනැත්තෙකුට අයිති උපරිමයට වැඩි කෘෂිකාර්මික ඉඩම් පවරා ගැනීම හා ඒ ඉඩම්වල නිෂ්පාදනය සහ ඒ ඉඩම්වලින් ඇති වන රැකී රක්ෂා ප්‍රමාණය වැඩිවීමේ ප්‍රතිඵලය ගෙනදෙන ක්‍රමයකට ඒවා ප්‍රයෝජනයට ගැනීම.

1.3 කාර්යභාරය, ආයතන ස්ථාපනය, කොමිෂන් සභාවේ සංයුතිය සහ නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්

1.3.1 කාර්යයන්

1. ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධානයන්ට අනුව පුද්ගලයෙකුට තබා ගත හැකි උපරිම ඉඩම් ප්‍රමාණය නීත්‍යානුකූල කිරීම.
2. උපරිමයට වැඩි ඉඩම් හඳුනාගෙන කොමිෂන් සභාව සතු කර ගැනීම.
3. පනතින් ලැබී ඇති ප්‍රතිපාදන අනුව නීතිමය බැඳීම් නිදහස් කිරීම.
4. කොමිෂන් සභාව සතු කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් ප්‍රකාශකයින්ට වන්දි මුදල් ගෙවීම.

5. පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබාදීමට කටයුතු කිරීම.
6. ඉඩම් ලේඛනය යාවත්කාලීන කරමින් ක්ෂේත්‍රය හා සම්බන්ධ වී ඉඩම් තොරතුරු ඒකරාශී කිරීම.
7. රටේ ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීම.
8. රටේ සමාජ සංවර්ධනයට ඉඩම් දායකත්වය ලබාදීම.
9. ආදායම් රැස්කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
10. ආයතනික සංවිධානය ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීම.
11. පුහුණු හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ඇති කරලීම.
12. ආයතනික ඵලදායිතාවය වැඩි දියුණු කිරීමට අවශ්‍ය භෞතික සම්පත් හා පහසුකම් සලසා දීම.

1.3.2 ආයතනය ස්ථාපනය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මඟින් පිහිටුවා ඇත.

1.3.3 කොමිෂන් සභාවේ සංයුතිය

1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත 45 වගන්තිය අනුව පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සංයුතිය මෙසේය.

i.	ගරු විෂය භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන	-	සභාපති
ii.	ගරු විෂය භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින්	-	05
iii.	නිල බලයෙන් පත් කරනු ලබන සාමාජිකයින්	-	03

කොමිෂන් සභාවේ කාර්යයන් ක්‍රියාවට නැංවීමෙහිලා උපයෝගී කරගනු ලබනුයේ මෙම කොමිෂන් සභා අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් ගනු ලබන තීරණ හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත වන අතර, එක් එක් කාර්ය සඳහා කොමිෂන් සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ලබා ගනු ලැබේ. 1972 වර්ෂයේ සිට 2024.12.31 දින දක්වා කොමිෂන් සභා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 812 ක් පවත්වා ඇත.

1.3.4 නීතිමය බලය හා කාර්යයන් පිළිබඳ පනත්

i. 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත
ii. 1975 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iii. 1981 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධන) පනත
iv. 1981 අංක 39 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
v. 1986 අංක 14 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
vi. 1986 අංක 18 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

අංක (i) හා (ii) පනත් අනුව, දේශිය ප්‍රකාශකයින්ගෙන්, රන් පවුම් සමාගම් වලින් හා රුපියල් සමාගම් වලින් ඉඩම් අක්කර: 1,809,495 රූඩ්: 3 පර්: 3.74 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. ඉහත අංක (i) හා (ii) පනත් සම්බන්ධව,

i. සංශෝධනයන් - අංක iii හා vi පනත් වලින් ද
ii. විධිවිධානයන් - අංක iv, v හා vi පනත් වලින්ද සලසා ඇත.

1.4 සංවිධාන සැලැස්ම



ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
සභාපති
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ(පාලන)
අධ්‍යක්ෂ (මුදල්)
අධ්‍යක්ෂ(ඉඩම්)
අධ්‍යක්ෂ(නීති)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (පාලන)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (මුල්‍ය)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (ආදායම්)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (ව්‍යාපෘති)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (ඉ.උපරිම සීමා)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (ඉඩම් පැවරීම්)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (මැණුම්)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (තක්.හා වන්දි)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (කලාප)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (නීති)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (විමර්ශන)
නි. අධ්‍ය./ ස. අධ්‍ය. (අභ්‍යන්. විගණක)
පරිපාලන නිලධාරි
තොරතුරු තාක්ෂණ නිලධාරි
ගිණුම් නිලධාරි
සැලසුම් ශිල්පි
තක්සේරු පරීක්ෂක
කළමනාකරණ සහකාර
ප්‍රවාහන සහකාර
කළමනාකරණ සහකාර
රියදුරු/ කාර්යාල කාර්ය සහායක
කාර්යාල කාර්ය සහායක

1.5 අංශ සහ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

1.5.1 ප්‍රධාන අංශයයන්

i. කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය
ii. ඉඩම් අංශය
iii. මුදල් අංශය
iv. නීති අංශය

1.5.2 දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල

කොමිෂන් සභාව දිවයින පුරා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් පැතිරි පවතින දිස්ත්‍රික් කාර්යාල 20 කින් සමන්විත වේ. මෙම දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩල කාර්යාල විසින් පහත කටයුතු සිදු කරනු ලබයි.

- දිස්ත්‍රික් කාර්යාල පරිපාලනය කිරීම.
- අමාත්‍යාංශය හා ප්‍රධාන කාර්යාලයේ පැවැත්වෙන සාකච්ඡා හා සම්මන්ත්‍රණ වලට සහභාගී වීම.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙනුවෙන් දිස්ත්‍රික්කයේ පැවැත්වෙන ජංගම සේවා වලට සහභාගී වීම.
- කට්ටිකරුවන් තෝරා ගැනීමේ පරීක්ෂණ පැවැත්වීම.
- රජයේ අවශ්‍යතාවය සඳහා ආයතනවලට හා පුද්ගලික ආයතන වලට ඉඩම් ලබා දීම.
- දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන ඔප්පු ලබාදීමේ උත්සව සංවිධානය කිරීම.
- පවරා ගෙන ඇති නමුත් පනතින් බැහැර වන ඉඩම් ආපසු ලබා දීමට අදාල කටයුතු.
- රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම සම්බන්ධීකරණය හා පසු විපරම් කටයුතු.
- විධිමත් පරිදි අත්පත් කර නොගත් ඉඩම් අත්පත් කර ගැනිම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- බෙදා දීමට සුදුසු ඉඩම් කොටස් මැණුම් කිරීම සඳහා පෙන්වා දී මිනුම්දෝරුවන්ට සහය වීම.
- කට්ටිකරුවන් වෙත මායිම් පෙන්වා දීම, ඔප්පු සකස් කිරීමේ මූලික කටයුතු ඉටුකිරීම.
- දිස්ත්‍රික් ඉඩම් ලේඛණ සැකසීම යාවත්කාලීන කිරීම හා ඊට අදාල රාජකාරි කටයුතු.
- දිස්ත්‍රික්කයේ ඉඩම් ලේඛණය, බැහැර කළ ඉඩම් ලේඛණය හා අනවසර ලේඛණය යාවත්කාලීන කිරීම.
- මාසිකව භෞතික හා මූල්‍ය ප්‍රගති වාර්තා සකස් කර ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික්කයට අදාළ විගණන විමසීම් හා ලිපි සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය සමඟ සාකච්ඡා කර ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීම.
- දිස්ත්‍රික්කයට අදාළ ඉඩම් නඩු සඳහා අධිකරණයේ පෙනී සිටීම.
- තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ඊට අදාළ තොරතුරු ප්‍රධාන කාර්යාලයේ තොරතුරු නිලධාරි වෙත නියමිත කාලයේ දී ඉදිරිපත් කිරීම.

දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩල කාර්යාල පිහිටුවා ඇති දිස්ත්‍රික්ක සහ ලිපිනයන් පහත පරිදි වේ.

වගුව 01: දිස්ත්‍රික් කාර්යාල විස්තර			
අනු අංකය	පළාත	දිස්ත්‍රික් කාර්යාල	ලිපිනය
1	බස්නාහිර පළාත	කොළඹ	සෙන්ට්‍රල් ෆාමසි ගොඩනැගිල්ල, පාදුක්ක
		කළුතර	අංක 184/A , පන්සල පාර, කළුතර උතුර
		ගම්පහ	කාර්යාල අංක 22, 6 වෙනි මහල, ලක්සියනෑ මන්දිරය, ගම්පහ
2	දකුණු පළාත	ගාල්ල	අංක 27, රිච්මන්ඩ් කන්ද පාර, කළුවැල්ල, ගාල්ල
		මාතර	අංක 17/ඒ, ධර්මරත්න පාර, උයන්වත්ත, මාතර
		හම්බන්තොට	උසාවිය පාර, තංගල්ල
3	ඌව පළාත	මොණරාගල	ජනසවි ගොඩනැගිල්ල, කච්චේරි හන්දිය, මොණරාගල
		බදුල්ල	අංක 181, කැප්පෙටිපොළ පාර, බදුල්ල
4	නැගෙනහිර පළාත	අම්පාර	දිසාපති කාර්යාලය, අම්පාර
		මඩකලපුව	දිසාපති කාර්යාලය, මඩකලපුව
5	උතුරු පළාත	යාපනය	දිසාපති කාර්යාලය, යාපනය
6	උතුරු මැද පළාත	අනුරාධපුර	අංක 388/33, 1 වන පියවර, හරිස්චන්ද්‍ර මාවත, අනුරාධපුරය
7	සබරගමුව පළාත	රත්නපුර	ෆාම් ගාඩ්න් වත්ත, නව නගරය, රත්නපුර
		ඇඹිලිපිටිය	අංක 796, 2 කණුව, මිද්දෙනිය පාර, නව නගරය, ඇඹිලිපිටිය
		කෑගල්ල	දිසාපති කාර්යාලය, කෑගල්ල
8	වයඹ පළාත	පුත්තලම	පම්බල, කාකපල්ලිය, මාදම්පේ
		කුරුණෑගල	අංක 16, උතුරු වැව පාර, කුරුණෑගල
9	මධ්‍යම පළාත	නුවරඑළිය	I.R.D.Pගොඩනැගිල්ල, උඩුපුස්සැල්ලාව පාර, නුවරඑළිය
		මහනුවර	සිව්වන මහල, ජාතික නිවාස ගොඩනැගිල්ල, මහනුවර
		මාතලේ	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ධර්මපාල මාවත, මාතලේ

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන අංශය

2.1.1 ආයතනික කටයුතු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2024 වර්ෂය හා සසඳමින් මෙම වර්ෂයේ ආයතනික කටයුතු කාර්ය සාධනය 02 වගුව මඟින් ඉදිරිපත් කොට ඇත.

වගුව 02: 2024 වර්ෂයේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු

අනු අංකය	විස්තර	පෙර වර්ෂය (2023)			ප්‍රවර්තන වර්ෂය (2024)		
		ඉල්ලීම් සංඛ්‍යාව	අනුමත කල සංඛ්‍යාව	ඉතිරි සංඛ්‍යා ව	ඉල්ලීම් සංඛ්‍යාව	අනුමත කල සංඛ්‍යාව	ඉතිරි සංඛ්‍යාව
1.	සේවයට බඳවා ගැනීම්	-	02	-	-	-	-
2.	විභාග පැවැත්වීම්	-	-	-	-	-	-
3.	සේවය ස්ථිර කිරීම්	-	-	-	-	-	-
4.	උසස් කිරීම්	-	01	-	-	03	-
5.	වැටුප් වර්ධක ගෙවීම්	-	290	-	-	265	-
6.	සේවය දීර්ඝ කිරීම්	70	70	-	62	62	-
7.	බඳවා ගැනීමේ පරිපාටි සැකසීම	01	-	01	01	-	01
8.	සේවයෙන් විශ්‍රාම ගැනීම්	-	23	-	-	10	-
9.	සේවයෙන් ඉල්ලා අස්වීම් හා හැරයෑම්	-	-	-	15	15	-
10.	වැඩ තහනම් කිරීම්	-	01	-	-	01	-
11.	නැවත සේවයේ පිහිටුවීම්	-	01	-	-	01	-
12.	විනය පරීක්ෂණ	-	03	-	-	04	-
13.	විදේශ නිවාඩු අනුමත කිරීම්	-	04	-	-	06	-
14.	පුහුණු කිරීම්	18	08	10	18	07	11
15.	අමාත්‍ය මණ්ඩල සංදේශ	-	03	-	-	07	-
16.	ණය අනුමත කිරීම්						
	I. දේපල	-	-	-	-	-	-
	II. වාහන	-	-	-	-	-	-
	III. වෙනත්	695	695	-	254	254	-

2.2 ඉඩම් අංශය

2.2.1 ඉඩම් පැවරීම් අංශය

03 වගුව මඟින් 2024.01.01 සිට 2024.12.31 දිනට ඉඩම් පැවරීම් අංශයේ කාර්ය සාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 03 : 2024 වර්ෂයේ ඉඩම් පැවරීම අංශයේ කාර්ය සාධනය			
අනු අංකය	ව්‍යාපෘති	වාර්ෂික ඉලක්කය	නිම කල සංඛ්‍යාව
1.	නිවාස අරමුණු හා ජීවනෝපාය සලසා ගැනීමේ අවශ්‍යතාවය මත ඉඩම් විකිණීම්. ඔප්පු ප්‍රදානය හා ශාසනාභිවන්දා ඔප්පු ලබාදීම.	6000	4505

2.2.2 ව්‍යාපෘති අංශය

04 වගුව මඟින් 2024.01.01 සිට 2024.12.31 දිනට ව්‍යාපෘති අංශයේ කාර්ය සාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 04 : 2024 වර්ෂයේ ව්‍යාපෘති අංශයේ කාර්ය සාධනය			
අනු අංකය	ව්‍යාපෘති	වාර්ෂික ඉලක්කය	නිම කල සංඛ්‍යාව
1.	ඖෂධ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම. (අක්කර)	100	10
2.	කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීම (අක්කර).	1500	88
3.	කර්මාන්ත අමාත්‍යාංශ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම. (අක්කර)	50	09

❖ අංක අමප/22/1769/640/012 හා 2022.11.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය හා ජනාධිපති ලේකම්ගේ PS/PSB/AS-02/LAND/2023 හා 2023.05.25 දිනැති ලිපිය මඟින් සියළුම බැහැර කිරීම් නවතා ඇත.

2.2.3 ඉඩම් උපරිම සීමා අංශය

05 වගුව මගින් 2024.01.01 සිට 2024.12.31 දිනට ඉඩම් උපරිම සීමා අංශයේ කාර්ය සාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 05 : 2024 වර්ෂයේ ඉඩම් උපරිම සීමා අංශයේ කාර්ය සාධනය			
අනු අංකය	විස්තරය	ඉලක්කය	නිම වූ සංඛ්‍යාව
1.	19 වන වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ඉඩම් ලබාදීම.	08	07
2.	14 වන වගන්තිය යටතේ ඉඩම් ලබාදීම.	16	25
3.	22 වන වගන්තිය යටතේ - පවුල තුල පැවරීම් ලෙස ඉඩම් ලබාදීම. - බාලවයස්කාර යටතේ ඉඩම් ලබාදීම.	08	01
4.	ප්‍රකාශක නොවන අයගේ ඉඩම් නිදහස් කිරීම.	08	01

❖ ඉහත ප්‍රගතිය සඳහන් කිරීමේදී ලබාදී ඇති ඔප්පු හා ගැසට් පත්‍ර අනුව අගයන් දක්වා ඇත. පුද්ගලයන් ප්‍රමාණය අඩුකිරීම සඳහා ප්‍රමාණවත් ඉඩම් කොමිෂන් සභාව සතුව නොමැති බැවින්, එය මන්දගාමීව සිදුවන බව කාරුණික දැන ගැනීම සඳහා සඳහන් කරමි.

2.2.4 රාජ්‍ය ආයතන අංශය

06 වගුව මගින් 2024.01.01 සිට 2024.12.31 දිනට රාජ්‍ය ආයතන අංශයේ කාර්ය සාධනය පෙන්නුම් කරනු ලබයි.

වගුව 06 : 2024 වර්ෂයේ රාජ්‍ය ආයතන අංශයේ කාර්ය සාධනය			
අනු අංකය	විස්තරය	ඉලක්කය (අක්කර)	නිම වූ සංඛ්‍යාව (අක්කර)
1.	පළාත් පාලන ආයතන වලට විකිණීමෙන් ලබාදීම.	80	105
2.	ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා විකිණීමෙන් ලබාදීම.	3374	158

❖ ඉහත අක්කර ප්‍රමාණය වාර්තා කැඳවීම්, මැනුම් නියෝග, කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම්, තක්සේරු කැඳවීම්, තක්සේරුව දැනුම් දීම, ඇමතිතුමාගේ අනුමැතිය හා ඔප්පු අංශයට යොමු කිරීමට අදාළ අක්කර ප්‍රමාණය වේ.

2.3 නීති අංශය

07 වගුව මඟින් 2024.01.01 සිට 2024.12.31 දිනට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් මෙහෙයවනු ලැබූ නඩු කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබයි.

වගුව 07 : 2024 වර්ෂයේ නඩු කටයුතු පිළිබඳ සංඛ්‍යා දත්ත						
අනු අංකය	විස්තරය	2023.12.31 දිනට පවතින නඩු	2024 වර්ෂය තුළ නිම වූ සමතයට පත් වූ නඩු	2024 වර්ෂය තුළ පවරන ලද නඩු සංඛ්‍යාව		2024.12.31 දිනට පවතින නඩු
				ඉ.ප්‍ර.කො.ස විසින් පවරන ලද	ඉ.ප්‍ර.කො.ස. විරුද්ධව	
1.	ශ්‍රේෂ්ඨාධිකරණය	57	05	03	08	63
2.	අභියාචනාධිකරණය	81	15	00	20	86
3.	මහාධිකරණය	45	04	00	04	45
4.	දිසා අධිකරණය	767	27	00	95	835
5.	මහේස්ත්‍රාත් අධිකරණය	120	17	24	00	127
6.	කම්කරු විනිශ්චය සභාව	01	01	00	02	02
7.	මානව හිමිකම් කොමිෂන් සභාව	22	00	00	06	28
8.	සිවිල් අභියාචනා මහාධිකරණය	30	08	00	24	46
	එකතුව	1123	77	27	159	1232

2.4 අභ්‍යන්තර විගණන අංශය

2.4.1 විගණනය සඳහා බලය

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත හා 1971 අංක 38 දරන මුදල් පනත අනුව සැකසුන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා මුදල් සංග්‍රහයේ 11 වන කොටසේ 02 වන වගන්තියේ අනු වගන්ති 01 – 03 අනුව විගණනය සඳහා බලය ලැබී ඇත.

2.4.2 වසර තුළ ඉටු කරන ලද රාජකාරි

වගුව 08 : 2024 වර්ෂය තුළ විගණන අංශය විසින් සිදුකල රාජකාරි		
අනු අංකය	විස්තරය	
1.	කාර්යාල විගණනය	04
2.	විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන විමසුම් නිකුත් කිරීම	29
4.	ආයතනික විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්	02
5.	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීට අවශ්‍ය වාර්තා සැකසීම හා තොරතුරු ලබාදීම	
6.	2024 අමාත්‍යාංශයීය විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමට අදාළ කටයුතු සිදු කිරීම.	
7.	ප්‍රසාද දීමනා සම්බන්ධ වවුචර්පත්, වැටුප් රහිත නිවාඩු සමඟ ගැලපීම් කර විගණනය කිරීම.	
8.	සියළු නව පත්වීම් වලට අදාළ වැටුප් පරීක්ෂා කිරීම.	

....

ආර්. කේ. නිහාල්

සභාපති

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ආර්.කේ. නිහාල්
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

3. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම.

3.1.1. ආයතනික තොරතුරු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පිහිටුවන ලදී. එහි අරමුණ වූයේ, ඕනෑම පුද්ගලයෙකුට අයත් නියමිත උපරිම සීමාව ඉක්මවන කෘෂිකාර්මික ඉඩම් පවරා ගැනීම සහ එම ඉඩම්වල ඵලදායිතාව සහ එමඟින් ජනනය වන රැකියා අවස්ථා වැඩිවන ආකාරයට ප්‍රයෝජනයට ගැනීමයි. පසුව, ඉහත පනත කාලීන හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුව 1975 අංක 39, 1981 අංක 14, 1981 අංක 39, 1986 අංක 14 සහ 1986 අංක 18 ලෙස කිහිප වතාවක් සංශෝධනය කර ඇත.

2015 ජූනි 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/3/2015 ට අනුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව රාජ්‍ය හිමිකාරීත්ව ව්‍යවසායන්හි "C" උප - කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇත.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේහි ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

කොමිෂන් සභාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ ඉඩම් හිමියන්ගේ ව්‍යවස්ථාපිත බැඳීම් නිදහස් කිරීම සහ ඔවුන්ට වන්දි ගෙවීම, පවරාගත් ඉඩම් ඵලදායී ආයෝජන සඳහා යෙදවීම සහ කොමිෂන් සභාවේ ආදායම් එකතු කිරීම, ඉඩම් ආරක්ෂා කිරීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ සුබසාධනයයි .

2024 වර්ෂය අවසානයේදී කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව 472 ක් විය.

නිකුත් කිරීම සඳහා බලය පැවරීමේ දිනය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ හි 2024 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2025 පෙබරවාරි 20 වන දින කොමිෂන් සභාව විසින් සහතික කරන ලදී.

අඛණ්ඩ පැවැත්මේ පදනම

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්මේ පදනම මත සකස් කර ඇත.

මූල්‍ය කාල සීමාව

කොමිෂන් සභාවේ මූල්‍ය කාල සීමාව 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා මාස දොළහක කාල පරිච්ඡේදයක් නියෝජනය කරයි.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම
අනුකූලතා ප්‍රකාශය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ හි මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) 1 සිට 20 දක්වා ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. SLPSAS 1 ට අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින්

සමන්විත වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදාගත් ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් ප්‍රකාශ කර නොමැති නම්, මෙම ප්‍රතිපත්ති ඉදිරිපත් කර ඇති සියලුම කාලසීමා සඳහා ස්ථාවරව යොදාගෙන ඇත.

මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම සහ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර, අදාළ සටහන් යටතේ සාධාරණ අගය පිළිබඳව සුදුසු හෙළිදරව් කිරීම් සිදු කර ඇති අවස්ථා හැරෙන්නටය.

සංසන්දනාත්මක තොරතුරු

වත්මන් කාලසීමාවේ සහ ආසන්නතම අතීත කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩිදියුණු කිරීම සහ සංසන්දනාත්මක බව වර්ධනය කිරීම සඳහා ප්‍රමාණාත්මක, ආඛ්‍යාමනය සහ විස්තරාත්මක තොරතුරු ඇතුළුව සංසන්දනාත්මක තොරතුරු පෙර කාලසීමාවට අදාළව හෙළිදරව් කරනු ලැබේ. අවශ්‍ය විටවී වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යා නැවත සකස් කර ඇත.

සාරභූතභාවය සහ සමූහගත කිරීම

සමාන අයිතමවල සෑම සාරභූත පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. අසමාන ස්වභාවයක් හෝ කාර්යයක් ඇති අයිතම, ඒවා අසාරභූත නම් මිස, වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන, කොමිෂන් සභාව ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ, කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

3.1.2. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ

කොමිෂන් සභාවේ දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ SLPSAS-07 ට අනුව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පවරාගත් ඉඩම් හැර, අනෙකුත් සියලුම ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2019 ජනවාරි 01 වන දිනට නැවත තක්සේරු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශනවල දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණවල අගයන් 2019 ට පෙර නැවත තක්සේරු කළ පදනම මත ද, 2019 වර්ෂයේදී සහ ඉන් පසුව මිලදී ගත් වත්කම් මිලදී ගත් පිරිවැය පදනම මත ද දක්වා ඇත. ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ අතිරික්තය හෝ හිඟය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ නැවත තක්සේරු සංචිතයක් ලෙස දක්වා ඇත. ශ්‍රී ලංකාවේ මහා භාණ්ඩාගාරයේ පාලක ජනරාල් කාර්යාලය විසින් ලබා දී ඇති උපදෙස් සහ මාර්ගෝපදේශ අනුව, දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අංක 03 දරන උපලේඛනයේ කාණ්ඩ හතරකට වර්ගීකරණය කර ඇත.

අස්පෘශ්‍ය වත්කම් හෙළිදරව් කිරීම

SLPSAS-20 ට අනුව, කොමිෂන් සභාවට අයත් සියලුම අස්පෘශ්‍ය වත්කම්, අස්පෘශ්‍ය වත්කම් යටතේ හෙළිදරව් කර ඇති අතර, එම අස්පෘශ්‍ය වත්කම් කොමිෂන් සභාවේ පවතින අස්පෘශ්‍ය වත්කම් ප්‍රතිපත්ති සමඟ සරල රේඛීය පදනමක් මත ක්‍රමක්ෂ කරනු ලැබේ. කොමිෂන් සභාවේ පවතින අස්පෘශ්‍ය වත්කම්වල වටිනාකම පසුව අංක 03 දරන උපලේඛනයේ හෙළිදරව් කෙරේ.

හඳුනාගැනීමේ සහ මැනීමේ පදනම

වත්කම හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ කොමිෂන් සභාවට ලැබීමේ සම්භාවිතාවක් ඇත්නම් සහ වත්කමේ වටිනාකම විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්, දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ හඳුනාගනු ලැබේ. අලුත්වැඩියා සහ නඩත්තු වියදම්, ඒවා සිදු වූ විට සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. දරන වටිනාකම අයකරගත නොහැකි බවට සිදුවීම් හෝ තත්ත්වයන්ගේ වෙනස්වීම් ඇඟවුම් කරන විට දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණවල දරන වටිනාකම හානිය සඳහා සමාලෝචනය කෙරේ.

ක්ෂය වීම

කොමිෂන් සභාවේ දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ ක්ෂය වීමේ ප්‍රතිපත්තිය 2018 වර්ෂයේ සිට සහ කොමිෂන් සභාවේ දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලියෙන් පසුව, ක්‍ෂය වන ශේෂ ක්‍රමයේ සිට සරල රේඛීය ක්‍රමය දක්වා වෙනස් කර ඇත. නව ක්ෂය වීමේ ප්‍රතිපත්තියට අනුව, අත්පත් කරගත් වත්කම් සහ නැවත තක්සේරු කළ වත්කම්, මිලදී ගත් දිනයේ මුළු අත්පත් කර ගැනීමේ පිරිවැයෙන් හෝ වත්කමේ නැවත තක්සේරු කළ මුදලෙන් රුපියලක වටිනාකමක් දක්වා ක්ෂය කරනු ලැබේ. වත්කමේ ඉතිරි වටිනාකම, වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය භාවිතා කරමින් එකවර වෙන් කරනු ලැබේ. 2017 ජුනි 28 වන දිනැති අංක 1/2017 දරන පාලක ජනරාල් කාර්යාලය විසින් නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍රලේඛයට අනුව, කොමිෂන් සභාවේ දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත ක්ෂය වීම් සහ ක්‍රමක්ෂ අනුපාත පහත පරිදි වර්ගීකරණය කර හෙළිදරව් කර ඇත.

වත්කම් කාණ්ඩය	ක්ෂය කිරීමේ අනුපාතය	වත්කම් කාණ්ඩය	ක්ෂය කිරීමේ අනුපාතය
ගොඩනැගිලි		වාහන	
කාර්යාල ගොඩනැගිලි	5%	මෝටර් වාහන	10%
සංචාරක බංගලා	5%	බයිසිකල් සහ මෝටර් බයිසිකල්	20%
ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ		**යන්ත්‍ර සූත්‍ර**	
ගෘහ භාණ්ඩ	10%	මාධ්‍ය උපකරණ	20%
පරිගණක සහ තොරතුරු තාක්ෂණ උපකරණ	20%	ඉදිකිරීම් උපකරණ	20%
පරිගණක මෘදුකාංග	20%	ශීතකරණ	20%
සන්නිවේදන උපකරණ	20%	විදුලි උපකරණ	20%
කාර්යාල උපකරණ	20%	ඉඩම් ශුද්ධ කිරීමේ උපකරණ	20%
ගෘහස්ථ උපකරණ	20%		

හඳුනාගැනීමෙන් ඉවත් කිරීම

දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ අයිතමයක් බැහැර කළ විට හෝ එහි භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනාගැනීමෙන් ඉවත් කරන ලදී. වත්කම හඳුනා ගැනීමෙන්, ඉවත් කිරීමෙන් පැන නඟින ඕනෑම ලාභයක් හෝ අලාභයක්, ශුද්ධ බැහැර කිරීමේ ලැබීම් සහ දරන මුදල අතර වෙනස ලෙස ගණනය කරනු ලබන අතර, වත්කම හඳුනා ගැනීමනීමෙන් ඉවත් කළ වර්ෂයේ සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

ආයෝජන වත්කම් - කොමිෂන් සභාවට පවරාගත් ඉඩම් හඳුනා ගැනීමේ සහ නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලිය

1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ කොමිෂන් සභාවට පවරාගත් ඉඩම්, SLPSAS 13 යටතේ ආයෝජන දේපළ ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇත. මීට හේතුව, පවරාගත් ඉඩම් දිගුකාලීන බදු පදනම මත කොමිෂන් සභාවේ ආදායම් උත්පාදන ක්‍රියාවලිය සඳහා භාවිතා කිරීමයි. කොමිෂන් සභාවට පවරාගත් ඉඩම් හඳුනාගැනීමේ සහ නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලිය තවමත් අඛණ්ඩව සිදුවන කාර්යයකි. හඳුනාගැනීමේ සහ නැවත තක්සේරු කිරීමේ ක්‍රිවාලියේ සංකීර්ණත්වය හේතුවෙන් මෙම කාර්යයන් දෙක සම්පූර්ණ කිරීමට වසර කිහිපයක් ගත විය හැකිය. දැනටමත් හඳුනාගත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පවරාගත් ඉඩම් නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලිය 2003 වර්ෂය ආරම්භයේදී ආරම්භ කර ඇත. 2024 වර්ෂය අවසානය දක්වා ශ්‍රී ලංකා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති නැවත තක්සේරු කළ ඉඩම් සංඛ්‍යා අංක 04 දරන උපලේඛනයේ හෙළිදරව් කර ඇත.

ඉන්වෙන්ටරි

කොමිෂන් සභාවේ ඉන්වෙන්ටරි, නිකුත් කරන ලද SLPSAS-09 ට අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කර ඇති අතර, පළමුවෙන් ඇතුළත් කළ දේ පළමුවෙන් නිකුත් කිරීමේ (FIFO) ක්‍රමය මත අගය කරනු ලැබේ. වර්ෂය අවසානයේදී ඉන්වෙන්ටරි, ඉන්වෙන්ටරිවල නවතම මිලදී ගැනීමේ පිරිවැය/ මිල මත ප්‍රකාශ කරනු ලැබේ. කොමිෂන් සභාවේ ඉන්වෙන්ටරිවලට ලිපිද්‍රව්‍ය සඳහා වන විවිධ ආකාරයේ අයදුම්පත් සහ පාරිභෝජන භාණ්ඩ ඇතුළත් වේ.

මූල්‍ය වත්කම් - මූලික හඳුනා ගැනීම සහ මැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 39 හි විෂය පථය තුළ ඇති මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයෙන් යුතු මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු දෑ සහ කල්පිරීම තෙක් දරන ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇත. කොමිෂන් සභාව ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවා අරම්භ වූ දිනයේ හඳුනා ගනී. කොමිෂන් සභාවේ මූල්‍ය වත්කම්වලට ලැබිය යුතු දෑ, කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්, කල්පිරීම තෙක් දරන මූල්‍ය වත්කම් සහ මුදල් සහ මුදල් සමානතා ඇතුළත් වේ. ණය සහ ලැබිය යුතු දෑ ඒවා ආරම්භ වූ දිනයේ හඳුනාගනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ ඒවායේ පිරිවැයෙන් ප්‍රකාශ කරනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ වෙළඳ ලැබිය දෑ, සේවක ණය සහ අත්තිකාරම්, තැන්පතු සහ අනෙකුත් ලැබිය යුතු දෑ වලින් සමන්විත වේ.

කොමිෂන් සභාවට ලැබිය යුතු මහා පරිමාණ දිගුකාලීන ණයගැතියන්

මූල්‍ය තත්ත්ව සටහන අංක 05 යටතේ දක්වා ඇති පරිදි දිගුකාලීන ණයගැතියන් රු.2,134,923,858.60 ක් ලෙස පෙන්වා ඇති අතර, එයින් රු. 2,068,913,696.98 ක් 1986 වර්ෂයේ සිට ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් (JEDB) සහ රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් (SPC) ලැබිය යුතු මහා පරිමාණ දිගුකාලීන ණයගැතියන් සඳහා වේ. 1995 සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එම මුදලෙහි වෙනසක් නොමැත. විශේෂයේ, කොමිෂන් සභාවට ලැබිය යුතු මහා පරිමාණ දිගුකාලීන ණයගැතියන් වසර විස්සකට වැඩි කාලයක සිට රජය හා සම්බන්ධ සංවිධාන/ ආයතන හයකින් සමන්විත වේත කොමිෂන් සභාවට ලැබිය යුතු එම මහා පරිමාණ දිගුකාලීන ණයගැතියන් පහත පරිදි වේ.

අනු අංකය	සංවිධානයේ / ආයතනයේ නම	ආරම්භක වර්ෂය	ලැබිය යුතු මුදල (.රු)
1	ජනතා වතු සංවර්ධන මණ්ඩලය/ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	1986/89/95	2,068,913,696.98
2	ශ්‍රී ලංකා හදබිම අධිකාරිය	1989	54,911,756.38
3	මැතිවරණ කොට්ඨාස සමුපකාර සමිති	1995	5,073,663.00
4	ඉඩම් අමාත්‍යාංශය	2003	3,252,654.00
5	විවිධ සේවා සමුපකාර සමිති	1980	3,126,685.98
එකතුව			**2,135,278,456.34**

ඉහත ලැබිය යුතු අදාළ සංවිධාන/ ආයතනවලින් අයකර ගැනීමට කොමිෂන් සභාව කිහිප වරක් උත්සහ කළ ද එම උත්සහායන් සාර්ථක වූයේ නැත. විශේෂයෙන්, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල කොමිෂන් සභාවට ගෙවිය යුතු කිසිදු වගකීමක් පිළිබිඹු නොවීම හේතුවෙන් එම අයකර ගැනීමේ උත්සාහයන් අසාර්ථක විය. එබැවින්, රජයේ ආයතන තුළ ගෙවීම් කරුණ සලකා බලා මෙම ගැටළුව විසඳීම සඳහා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු අදාළ පාර්ශවකරුවන්ගේ සහ මහා භාණ්ඩාගාරයේ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් රැස්වීමක් පවත්වන ලදී. මෙම සාකච්ඡා සහ අදාළ පාර්ෂව සහ බලධාරීන් අතර හුවමාරු වූ ලිපි ලේඛනවල ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (PED) විසින් නිකුත් කරන ලද රාජ්‍ය හිමිකාරීත්ව ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.9 වගන්තියට අනුව ක්‍රියා කිරීමට උපදෙස් දෙමින් 2023 ජූලි 17 වන දින නිකුත් කරන ලද කැබිනට් තීරණයක සාමාජිකයින් විසින් ද තහවුරු කර ඇත. එම මාර්ගෝපදේශ දෙකට අනුව, රාජ්‍ය හිමිකාරීත්ව ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.9 වගන්තියට අනුව පවතින ගැටළු නිරාකරණය සඳහා නිර්දේශ ලබා ගැනීමට කොමිෂන් සභාව විසින් පස් දෙනෙකුගෙන් යුතු කමිටුවක් පත්කර ඇත. මෙම පත් කරන ලද කමිටු සාමාජිකයින් 2023 ජූලි 17 යන දිනයන්හි රැස්වී සාකච්ඡා කර අදාළ සාක්ෂි සොයා බලා ඇත. ඉහත කී කමිටු සාමාජිකයින්ගේ සාකච්ඡා සහ අදාළ සාක්ෂි සොයා ගැනීම, කමිටු නිර්දේශ කොමිෂන් සභාවට ලබා දෙන තෙක් තවමත් සිදුවෙමින් පවතී. මෙම පත් කරන ලද කමිටු සාමාජිකයින් 2023 අගෝස්තු 29, 2023 නොවැම්බර් 07, 2024 අප්‍රේල් 09 සහ 2024 මැයි 30 යන දිනයන්හිදී අදාළ සාක්ෂි සාකච්ඡා කර සොයා බැලීම සඳහා සිව් වරක් රැස්වී ඇත.

මේ අතර, කොමිෂන් සභාවේ සාමාජිකයින් වන කොමිෂන් සභා 811 වන දින පැවති 28 අගෝස්තු 2024 රැස්වීමේදී ඉහත කාරණය පිළිබඳව දීර්ඝව සාකච්ඡා කර ඇති අතර, අවසානයේදී පහත සඳහන් මණ්ඩල යෝජනාව නිකුත් කර ඇත.

“පසුගිය කාලය පුරාවටම කොමිෂන් සභාව සහ අදාළ සංවිධාන සහ ආයතන ඉහත කී කාරණය සඳහා තිරසාර විසඳුමක් සෙවීමට විවිධ උත්සාහයන් සහ පියවර ගෙන ඇත. විශේෂයෙන්ම, 2016 වසරේ සිට කොමිෂන් සභාව විසින් අදාළ පාර්ශව, අමාත්‍යාංශ, සංවිධාන සහ ආයතන සමඟ එක්ව මෙම ගැටළුව විසඳීමේ ක්‍රියාවලිය කඩිනම් කළ නමුත්, කොමිෂන් සභාවට අවසන් තිරසාර විසඳුමක් සොයා ගැනීමට නොහැකි විය. එහෙයින්, කොමිෂන් සභාවේ සාමාජිකයින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරිය යුතු බවට අවසන් නිගමනයකට එළඹේ. තවද, පවරන ලද ඉඩමට අදාළ සියලු ලැබිය යුතු ගිණුම් කොමිෂන් සභාවේ ගිණුම් වාර්තා සහ ගිණුම් පොත්වල එලෙසම පැවතිය යුතුය. එමෙන්ම, කොමිෂන් සභාවේ ගිණුම් පොත්වල රු. 2,068,913,696.98 ක් වැනි විශාල මුදලක් ලෙස දැක්වෙන ලැබිය යුතු ගිණුම් ශේෂය, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට (JEDB) සහ රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් (SPC) එරෙහිව කපා හැරිය නොහැකි අතර, එම ලැබිය යුතු මුදල තවදුරටත් කොමිෂන් සභාවේ ගිණුම් පොත්වල එලෙසම පැවතිය යුතුය.”

කල්පිරීම තෙක් දරන මූල්‍ය වත්කම් (HTM)

වන්දි ගෙවීම සඳහා වන සංචිතය සහ කෙටි කාලයක් සඳහා රාජ්‍ය බැංකුවල ආයෝජනය කර ඇති කාලීන තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් සහ REPO වලින් ලැබිය යුතු පොලිය, කල්පිරීම තෙක් දරන මූල්‍ය වත්කම් (HTM) ආයෝජන යටතේ වර්ගීකරණය කර ඇත.

මුදල් සහ මුදල් සමාන දෑ

කොමිෂන් සභාවේ අතේ ඇති මුදල් චෙක් ගිණුම් තුනකින් සමන්විත වූ අතර, එම චෙක් ගිණුම් අරමුදල් කළමනාකරණ ගිණුම් තුනක් සහ ඉතුරුම් ගිණුම් දෙකක් සමඟ අන්තර් සම්බන්ධිත විය. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් සහ මුදල් සමානතාවල සංරචකයක් ලෙස, කොමිෂන් සභාවේ මුදල් කළමනාකරණයේ අනිවාර්ය අංගයක් වන පවතින බැංකු ශේෂයන් ඇතුළත් කර ඇත. මුදල් සහ මුදල් සමානතා, අතේ ඇති මුදල්, බැංකුවේ තැන්පතු වලින් සමන්විත වේ.

කපා හරින ලද දිගුකාලීන ණය ලැබිය යුතු දෑ

2021 නොවැම්බර් 08 වන දින පැවති 762 වන කොමිෂන් සභා සැසිවාරයේදී කොමිෂන් සභා පත්‍රිකා අංක 11593 සඳහා කොමිෂන් සභාවේ තීරණය ලබා දී ඇති අතර, රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2020 හි 2.2.1 වගන්තියට සහ මූල්‍ය රෙගුලාසි අංක 105 ට අනුව, කොමිෂන් සභාවට ලැබිය යුතු රු .500,000 ට අඩු දිගුකාලීන ණය කපා හැරීමට කොමිෂන් සභාව අනුමත කර ඇත.

සමස්ථ ආදායම් ලැබිය යුතු දෑ

කොමිෂන් සභාව විසින් නඩත්තු කරනු ලබන සමස්ථ බදුකරුවන්ගේ ලිපිගොනුවල ඇති ලිඛිත ලේඛන සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (GSMB) විසින් ලබා දෙන කාර්තුමය සමස්ථ එකතු කිරීම් ප්‍රමාණයන් පදනම් කරගනිමින්, 2023 වර්ෂය සඳහා ලැබිය යුතු සමස්ථ ආදායම කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලදී. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (GSMB) මඟින් ආදායම් එකතු කිරීම පදනම් කරගනු ලැබුවේ, පුපුරණ ද්‍රව්‍ය පාලක විසින් නිකුත් කරන ලද පුපුරණ ද්‍රව්‍ය (වෙඩි බෙහෙත්) ප්‍රමාණය මත පදනම්ව, සෑම සමස්ත බලපත්‍රලාභියෙකු විසින්ම කොමිෂන් සභාවට අයත් සමස්ත ඉඩම්වලින් ලබාගත් සමස්ත කියුබ් ප්‍රමාණය මතය.

වගකීම් සහ ප්‍රතිපාදන

වගකීමක් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ පියවීමට අපේක්ෂා කරන විට, ප්‍රධාන වශයෙන් දෛනික මෙහෙයුම් කටයුතු සඳහා දරන විට, වාර්තාකරණ කාල සීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත පියවීමට

නියමිත විට හෝ වාර්තාකරණ කාලසීමාවෙන් පසු අවම වශයෙන් මාස 12 ක් සඳහා වගකීම පියවීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැති විට එය ජංගම ලෙස වර්ගීකරණය කරන ලදී. කොමිෂන් සභාව අනිකුත් සියලුම වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කළේය.

කොමිෂන් සභාවේ ආයතනික ආදායම් බදු (CIT) වගකීම

ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRDSL) විසින් 2023 ඔක්තෝම්බර් 17 වන දින දරන දැන්වීමක් මඟින්, 2018 බදු වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි කොමිෂන් සභාව විසින් ආයතනික ආදායම් බද්ධ (CIT) ගෙවීමට බැඳී සිටින බව දන්වා ඇත. මන්දයත්, කොමිෂන් සභාව 2017 ජූනි 14 වන දින එකතු කළ අගය මත බද්ධ (VAT) සඳහා ලියාපදිංචි වී ඇති අතර, 2017 ජූලි 01 වන දින එකතු කළ අගය මත බද්ධ (VAT) එකතු කිරීම නිල වශයෙන් ආරම්භ කර තිබීමයි. අනෙක් අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ආයතනික ආදායම් බදු සහන ලබන සංවිධාන/ ආයතන නාම ලේඛනයේ කොමිෂන් සභාවේ නම ඇතුළත් නොවේ.

ඉන් අනතුරුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු වර්ෂය සලකා බලනවා වෙනුවට කොමිෂන් සභාවේ මූල්‍ය කාලපරිච්ඡේදය (ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා) පදනම් කරගෙන ආයතනික ආදායම් බද්ධ ගෙවීමට අවසර ඉල්ලා කොමිෂන් සභාව විසින් 2023 නොවැම්බර් 24 සහ 2024 පෙබරවාරි 08 යන දිනයන්හිදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නිල වශයෙන් ඉල්ලීමක් කරන ලදී. එම තීරණය තවමත් ලැබී නොමැති අතර, කොමිෂන් සභාව ඒ පිළිබඳ තීරණයක් අපේක්ෂාවෙන් සිටී. එමෙන්ම, කොමිෂන් සභාව විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව, පසුගිය වසර දෙක වන 2023 සහ 2022 සඳහා ගෙවිය යුතු ආයතනික ආදායම් බද්ධ (CIT), පිළිවෙලින් රු. 197,395,710.57 ක් සහ රු. 134,748,888.05 ක් ලෙස ගෙවා ඇත.

තවදුරටත්, 2024 වර්ෂයේ අවසන් කාර්තුවේ සිට වත්මන් වර්ෂය සඳහා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අයවැය ඇස්තමේන්තු මත පදනම්ව, ඇස්තමේන්තුගත ආයතනික ආදායම් බද්ධ (CIT) ගෙවීමට කොමිෂන් සභාව කටයුතු සම්පාදනය කර ඇත. වත්මන් වර්ෂය සහ පසුගිය වසර හතර වන 2018, 2019, 2020 සහ 2021 සඳහා වන ගෙවිය යුතු ආයතනික ආදායම් බදු ප්‍රතිපාදන, ආයතනික ආදායම් බදු කෙටුම්පත් ගණනය කිරීම් මත පදනම්ව සලසා ඇත.

ඉසුෆාලි සමාගමට ගෙවිය යුතු අධිකරණ වන්දි

ඉසුෆාලි සමාගම විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට එරෙහිව නඩු හයක් ගොනු කරමින් කියා සිටියේ, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ වගන්තිය සහ කොමිෂන් සභා පනත මඟින් සපයා ඇති විධි විධාන උල්ලංඝනය කරමින් ඉසුෆාලි සමාගමේ තේ වගා කළ ඉඩම් නීති විරෝධී ලෙස අත්පත් කරගත් බවයි. 2001 පෙබරවාරි 23 වන දින නිකුත් කරන ලද අධිකරණ තීන්දුවේ සිට 2023 දෙසැම්බර් 31 වන දින දක්වා එම නඩු හය සඳහා ගෙවිය යුතු මුළු වන්දි මුදල රු. 708,522,878.89 කි. ඉසුෆාලි සමාගම අවසානයේ ඔවුන්ගේ නඩු හයේ වන්දිය සඳහා ශ්‍රී ලංකා රුපියල් 500,000,000.00 ක් පිළිගැනීමට එකඟ විය. ඉසුෆාලි සමාගම සඳහා රු. 500,000,000.00 ක් ගෙවීමට සහ කැබිනට් අනුමැතිය ලබා ගැනීමට 2024 ජනවාරි මාසයේදී කැබිනට් පත්‍රිකාවක් කැබිනට් මණ්ඩලය වෙත යොමු කරන ලදී. 2024 පෙබරවාරි 27 දින ලැබුණු AMP/24/0177/615/002 යන කැබිනට් තීරණයට සහ 2024 මාර්තු 13 දින ලැබුණු E/79/2024 යන ලිපිය මඟින් නීතිපතිවරයාගේ අනුමැතිය සහ නිර්දේශ මත අවසානයේ එකඟ වූ වන්දි මුදල ලෙස රු. 500,000,000.00 ක් 2024 අප්‍රේල් 30 වන දින ඉසුෆාලි සමාගම වෙත කොමිෂන් සභාව විසින් ගෙවන ලදී.

විය හැකි වගකීම්

කොමිෂන් සභාවට එරෙහිව අතීත සහ වර්තමාන නීතිමය ක්‍රියාමාර්ග කිහිපයක් සමඟ ඇස්තමේන්තු කර ඇති අතර, අනාගතයේදී කොමිෂන් සභාවට අංක 22 දරන සටහනේ ඇති ඇස්තමේන්තුගත විය හැකි වගකීම වන රු .164,000,000.00 ක වටිනාකමක් පිටස්තරයින්ට ගෙවීමට සිදුවිය හැක.

විය හැකි වත්කම්

සමාගමට අනාගතයේදී ලැබීමට නියමිත රු .43,398,475.00ක වටිනාකමකින් යුත් වත්කම් (contingent assets) පවතින බව කොමිෂන් සභාව විසින් තක්සේරු කර ඇත. මේවා කොමිෂන් සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව ගනු ලැබූ අතීත සහ වර්තමාන නීතිමය ක්‍රියාමාර්ග මත පදනම් වූ ඒවා වේ. නමුත්, නඩු ජයග්‍රහණයේ සම්භාවිතාව 50%ට වඩා අඩු බැවින් මෙම මුදල මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොකර විස්තර සටහනක් ලෙස පමණක් දක්වා ඇත.

ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස කොමිෂන් සභාවට නෛතික හෝ ව්‍යවස්ථාපිත බැඳීමක් ඇති විට, බැඳීම පියවීම සඳහා වත්කම් පිටතට ගලා යාමේ සම්භාවිතාවක් ඇති විට සහ බැඳීම විශ්වාසදායක ලෙස මැනිය හැකි විට, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් හඳුනාගනු ලැබේ.

ගෙවිය යුතු වන්දි අත්හිටුවීම්

ගෙවිය යුතු පළමු අදියරේ වන්දි අත්හිටුවීම්

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ කොමිෂන් සභාවට ඉඩම් පවරා ගත් අතර පසුව එම පනත කොමිෂන් සභාවේ කාලීන හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා මත කිහිප වතාවක් සංශෝධනය කරන ලදී. කොමිෂන් සභාව විසින් ඔවුන්ගේ පුද්ගලික, පවුල් සහ සංවිධාන සහ සංස්ථා සතු ඉඩම් ප්‍රකාශ කළ අයට වන්දි ගෙවීමට සිදුවිය. ඉහත පවරාගත් ඉඩම්වල පළමු අදියරේ වන්දි ගෙවීම පුද්ගලයන්, පවුල් සහ සංවිධාන සඳහා 1974 වර්ෂයේ සිට ආරම්භ වූ අතර, මේ වන විට කොමිෂන් සභාව රු. 1,495,000,000.00 කින් රු. 1,389,337,130.67 ක වටිනාකමක් ගෙවා ඇත.

ගෙවිය යුතු දෙවන අදියරේ වන්දි අත්හිටුවීම්

වන්දි අත්හිටුවීමේ දෙවන අදියර යටතේ කොමිෂන් සභාවට පවරාගත් රුපියල් සමාගම් සහ ස්ටර්ලින් පවුම් සමාගම්වල ඉඩම් සඳහා වන්දි ගෙවීමට අවධානයට යොමු කෙරේ. කොමිෂන් සභාව විසින් දෙවන අදියරේ වන්දි ගෙවීමේ ක්‍රියාවලිය 1985 සිට 2004 දක්වා ආරම්භ කරන ලදී. එම කාලය තුළ කොමිෂන් සභාව රු. 1,250,000,000.00 කින් රු. 1,140,040,507.05 ක වටිනාකමක් ගෙවා ඇත.

සේවක අර්ථසාධක ප්‍රතිලාභ සැලැස්ම

ඇගයීමේ ක්‍රමය සහ රක්ෂණ ගණිත උපකල්පන

කොමිෂන් සභාවේ සේවයෙන් පසු ප්‍රතිලාභ ගණනය කිරීම සඳහා (පාරිතෝෂික), Actuarial & Management Consultants (Pvt.) Limited වෙතින් වෘත්තීය උපදේශන සේවාව ලබාගෙන ඇත. සේවා සපයන්නාගේ ඇගයීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට (SLPSAS – 19) හි සඳහන් කර ඇති "Projected Unit Credit Method" ක්‍රමය භාවිතා කරමින් සිදුකර ඇත. ඇගයීම සඳහා භාවිතා කරන ලද රක්ෂණ ගණිත උපකල්පන ඔවුන්ගේ රක්ෂණ ගණිත වාර්තාවේ 2 වන කොටසේ විස්තරාත්මකව සාකච්ඡා කර ඇත.

ගිණුම්කරණ හෙළිදරව් කිරීම් සහ නිර්දේශ

කොමිෂන් සභාවේ 2023 මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් හෙළිදරව් කිරීම් දැක්වේ.

- 2024 දෙසැම්බර් 31 වන දිනට වගකීමේ වර්තමාන වටිනාකම රු .182,039,443.00 කි.
- 2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිළිගත් ශුද්ධ වගකීම රු.182,039,443.00 කි.
- සමස්ත ආදායම් ප්‍රකාශනයේ පිළිගත් මුදල රු .41,189,475.00 කි.
- 2024 දෙසැම්බර් 31 වන දිනට නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම (PVDBO) රු .182,039,443.00 කි.
- 2023 දෙසැම්බර් 31 වන දිනට නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම (PVDBO) රු .148,284,942.46 කි.

බදුකරණය

ආදායම් බද්ද

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 126 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවේ අතිරික්තය සහ ආදායම ආදායම් බද්ධට යටත් වේ.

වෙනත් බදු

කොමිෂන් සභාව විසින් ලබාගනු ලබන බදු ඉඩම් කුලී සහ අනෙකුත් සේවා ගාස්තු සම්බන්ධයෙන් 18%ක වැට් බද්ධ (VAT - අගය මත එකතු කළ බද්ධ) සහ 2.5%ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) ගෙවනු ලැබේ. කොමිෂන් සභාව විසින් කාලානුරූපව, රඳවා ගැනීමේ බද්ධට යටත්වන වියදම් ගෙවීමේදී, බදු නියෝජිතයෙකු ලෙස ක්‍රියා කරමින් රඳවා ගැනීමේ බද්ධ (WHT) කොමිෂන් සභාව විසින් එකතු කරනු ලැබේ.

රජයේ දායකත්වය, භාණ්ඩාගාර ප්‍රදාන සහ භාණ්ඩාගාරයට සෘජු ප්‍රේෂණ

ආරම්භයේදී, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීමේ අදියර සඳහා රජයේ දායකත්වයක් ලෙස ශ්‍රී ලංකා මහා භාණ්ඩාරය විසින් රු. 15,000,000/- ක් ලබා දෙන අතර, පසුව කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු. 1,949,075/- ක මුදලක් ප්‍රදානය කර ඇත. ඉහත සඳහන් භාණ්ඩාගාර දායකත්වයන් දෙක හැර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ක්‍රියාත්මක වන්නේ රජයේ අරමුදල් ලබා නොගෙන, කොමිෂන් සභාව විසින්ම උපයනු ලබන අරමුදල් භාවිතා කරමිනි.

සමස්ත ආදායම් ප්‍රකාශනයෙන් සංචිත වෙන් කිරීම

ඉඩම් විකිණීම, කුඹුරු ඉඩම් විකිණීම සහ ඉඩම් අත්පත් කර ගැනීම මගින් උත්පාදනය වන වාර්ෂික ආදායමෙන් 40% ක වටිනාකමක්, කොමිෂන් සභාව වෙත පවරා ගන්නා ලද ඉඩම් සඳහා එහි මුල් හිමිකරුවන්ට (ප්‍රකාශකයින්ට) වන්දි ගෙවීමේ අරමුණින් පවතින සංචිතය වෙත මාරු කරනු ලැබේ. එමෙන්ම, කොමිෂන් සභාවට එරෙහිව ලබා දෙන අධිකරණ තීන්දු මගින්ගෙවීමට නියම වන වන්දි ගෙවීම් සඳහා ද මෙම සංචිතය භාවිතා කළ හැකිය.

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වගුව 09 : 2024.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය			
විස්තරය	සටහන්	31.12.2024	31.12.2023
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	3	546,036,130.90	65,406,396.29
අස්පෘශ්‍ය වත්කම්			
පරිගණක මෘදුකාංගය	3	390,314.53	1,625,231.74
මුළු ජංගම නොවන වත්කම්		**546,426,445.43**	**67,031,628.03**
අයෝජන වත්කම්			
1972 අංක 01 දරන පනත යටතේ පවරන ලද ඉඩම්	4	905,285,000.00	905,285,000.00
ජංගම වත්කම්			
තොග - ලිපිද්‍රව්‍ය	5	8,944,152.70	8,670,147.59
වෙලඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	6	3,592,435,539.96	4,002,737,774.08
ලැබිය යුතු පොලී	7	13,367,331.11	140,948,662.16
තැන්පතු හා අත්තිකාරම්	8	91,893,037.62	86,586,139.86
කෙටි කාලීන බැංකු තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්	9	1,206,462,224.47	1,602,304,988.34
මුදල්, මුදල් හා සමාන දෑ	10	32,275,066.34	51,166,244.51
මුළු ජංගම වත්කම්		**4,945,377,352.20**	**5,892,413,956.54**
මුළු වත්කම්		**6,397,088,797.63**	**6,864,730,584.57**
වගකීම්			
සමුච්චිත අරමුදල් හා සංචිත			
සංචිත	11	2,473,991,941.76	2,214,606,103.30
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය		521,976,967.55	286,401,967.55
ස්ථාවර වත්කම් පරිත්‍යාග සංචිත		117,161.95	324,881.06
සමුච්චිත අතිරික්තය		1,939,361,823.99	2,116,741,864.69
මුළු සමුච්චිත අරමුදල් හා සංචිත		**4,935,447,895.25**	**4,618,074,816.60**
අරමුදල් සහ ප්‍රධාන			
රජයේ දායකත්වය හා භාණ්ඩාගාර ප්‍රධාන	12	499,075,000.00	514,075,000.00
මුළු අරමුදල් සහ ප්‍රධාන		499,075,000.00	514,075,000.00

ජංගම නොවන වගකීම්			
පාරිතෝෂිත සඳහා වෙන් කිරීම	13	182,432,367.64	148,284,942.46
වන්දි අවිනිෂ්ත ගිණුම - අදියර I	25	105,528,895.33	105,662,869.33
වන්දි අවිනිෂ්ත ගිණුම - අදියර II	26	109,959,492.95	109,959,492.95
මුළු ජංගම නොවන වගකීම්		397,920,755.92	363,907,304.74
ජංගම වගකීම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	14	198,896,657.44	717,806,610.83
ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු එකතු කළ අගය මත බදු		4,903,368.32	4,082,487.23
ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව		732,393.53	729,457.76
ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු		55,347.00	234,935.00
ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත උපයන විට ගෙවිය යුතු බදු		3,587.66	26,717,76
ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු ආදායම් බදු	15	360,053,792.51	645,793,254.65
මුළු ජංගම වගකීම්		564,645,146.46	1,368,673,463.23
මුළු වගකීම්		962,565,902.38	1,732,580,767.97
මුළු අරමුදල් සහ වගකීම්		6,397,088,797.63	6,864,730,584.57

ඉහත පිටු අංක 12 සිට 17 දක්වා දැක්වෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ සහ ඉදිරිපත් කර ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව බව සහතික කරමි. මෙම ප්‍රමිති නිකුත් කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිත කමිටුව මඟිනි.

....

එස්.පී.එස්.සේනානායක
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

එස්. පී. එස්. සේනානායක
අධ්‍යක්ෂ/මුදල්
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

....

ආර්. කේ. නිහාල්
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ආර්.කේ. නිහාල්
සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
නො. 475, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

....

ඩී. පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම,පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
"ගොවිජන මැදුර" ඉඩම් මහ ලේකම් කාර්යාලය
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

3.3 විස්තීරණ ආදායම් ප්‍රකාශනය

වගුව 10 : 2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය			
විස්තරය	සටහන්	31.12.2024	31.12.2023
ආදායම	16	689,241,625.03	835,065,640.29
වෙනත් මෙහෙයුම් ආදායම්	17	103,237,441.08	81,501,055.78
පරිපාලන වියදම්	18	(584,917,933.16)	(523,559,520.51)
සැපයුම් සහ අවශ්‍ය වියදම්	19	(29,508,882.30)	(38,073,617.73)
අනෙකුත් මෙහෙයුම් වියදම්	20	(48,826,244.05)	(47,900,917.06)
මෙහෙයුම් අතිරික්තය		**129,226,006.60**	**307,032,640.77**
මූල්‍ය ආදායම්	21	154,733,708.12	347,553,411.36
මූල්‍ය වියදම්	22	(698,932.64)	(18,535,308.07)
බදු පෙර අතිරික්තය		**283,260,782.08**	**636,050,744.06**
සංස්ථාපිත ආදායම් බදු	15	(86,794,901.70)	(197,395,710.57)
බදු පසු අතිරික්තය		**196,465,880.38**	**438,655,033.49**
2023.01.01 දිනට මුළු විස්තීරණ ආදායම		2,116,741,864.69	2,613,924,614.87
ඉඩම් අත්පත් කරගැනීම, ඉඩම් විකිණීම, කුඹුරු ඉඩම් විකිණීම් වලින් 40% ක සංචිතය		(259,385,838.46)	(214,115,687.45)
පෙර වර්ෂය සඳහා ගැලපීම්	23	(114,460,082.62)	(721,722,096.22)
2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පසු මුළු විස්තීරණ ආදායම		**1,939,361,823.99**	**2,116,741,864.69**

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

වගුව 11 : 2024.12.31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය			
විස්තරය	සටහන්	31.12.2024	31.12.2023
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය		283,260,782.08	636,050,744.06
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් අතිරික්තය			
ගැලපුම්:			
ක්ෂය කිරීම්	18	20,993,598.74	19,412,014.91
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	18.1	41,390,444.18	9,597,720.22
ආයෝජන ආදායම	21	-	(347,553,411.36)
මූල්‍ය ආදායම	16	(154,733,708.12)	(2,930,914.72)
මූල්‍ය වියදම	22	698,932.64	18,535,308.07
ස්ථාවර වත්කම් බැහැර කිරීමේ ලාභය/අලාභය	17	(68,410.54)	116,861.71
පෙර වර්ෂය සඳහා ගැලපීම්	23	(129,548,106.17)	(273,324,552.14)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය		**61,993,532.81**	**59,903,770.75**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ අඩුවීම හෝ වැඩිවීම		(516,806,484.63)	493,476,911.58
තොගය අඩුවීම් හෝ වැඩිවීම්		(274,005.11)	(1,703,962.59)
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ අඩුවීම හෝ වැඩිවීම		410,302,234.12	(441,606,722.08)
තැන්පතු හා අත්තිකාරම් අඩුවීම හෝ වැඩිවීම		(5,306,897.76)	(5,437,017.98)
මෙහෙයුම් ක්‍රියාකරකම් තුලින් ජනනය කරන මුදල් ප්‍රවාහය		**(50,091,620.57)**	**104,632,979.68**
පාරිතෝෂික ගෙවීම		(8,725,389.00)	(10,057,255.00)
වන්දි ගෙවීම		(133,974.00)	(123,100.00)
ආයතනික බදු ගෙවීම		(357,446,340.29)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද ශු. මුදල් ප්‍රවාහය		**(416,397,323.86)**	**94,452,624.68**
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය			
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම	3	(265,035,734.71)	(2,073,182.54)
ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන		(526,026,088.20)	(723,495,068.02)
ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් වසා දැමීම		999,868,852.07	660,574,561.36
ආයෝජන ආදායම		279,538,191.06	333,567,447.41

වෙන්දේසි කිරීම් හා වත්කම් බැහැර කිරීම මගින් ලද මුදල්		83,010.00	271,207.00
ලද මූල්‍ය ආදායම		-	2,930,914.72
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**488,428,230.22**	**271,775,879.93**
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය			
භාණ්ඩාගාරයට මුදල් යැවීම	12	(15,000,000.00)	(350,000,000.00)
මූල්‍ය පිරිවැය	22	(698,932.64)	(18,535,308.07)
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් මුදල් ගලාඒම්		2,776,848.11	-
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය		**(12,922,084.53)**	**(368,535,308.07)**
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වෙනස්වීම		59,108,821.83	(2,306,803.46)
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ		81,166,244.51	83,473,047.97
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**140,275,066.34**	**81,166,244.51**

3.5 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

වගුව 12. 2024.12.31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

විස්තරය	රජයේ දායකත්වය රු.	භාණ්ඩාගාර ප්‍රධාන රු.	ප්‍රාග්ධන සංචිත රු.	වෙනත් සමුච්චිත ආදායම් සංචිතය රු.	එකතුව රු.
2023.01.01 දිනට ආරම්භක ශේෂය	15,000,000.00	849,075,000.00	2,058,470,379.72	2,613,924,614.87	5,536,469,994.59
වර්ෂය සඳහා බදු පෙර ලාභය	-	-	-	438,655,033.49	438,655,033.49
භාණ්ඩාගාරයට මුදල් යැවීම	-	(350,000,000.00)	-	-	(350,000,000.00)
සංචිත දායතක්වය	-	-	214,115,687.45	(214,115,687.45)	-
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සහ පරිත්‍යාග සංචිත	-	-	228,746,884.74	-	228,746,884.74
පෙර වර්ෂය සඳහා ගැලපීම්	-	-	-	(721,722,096.22)	(721,722,096.22)
2023.12.31 අවසාන දිනට ශේෂය	15,000,000.00	499,075,000.00	2,501,332,951.91	2,116,741,864.69	5,132,149,816.60
2024.01.01 දිනට ආරම්භක ශේෂය	15,000,000.00	499,075,000.00	2,501,332,951.91	2,116,741,864.69	5,132,149,816.60
වර්ෂය සඳහා බදු පසු ලාභය	-	-	-	196,465,880.38	196,465,880.38
භාණ්ඩාගාරයට මුදල් යැවීම	-	(15,000,000.00)	-	-	(15,000,000.00)
සංචිත දායකත්වය	-	-	259,385,838.46	(259,385,838.46)	-
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය හා පරිත්‍යාග සංචිත	-	-	235,367,280.89	-	235,367,280.89
පෙර වර්ෂය සඳහා ගැලපීම්	-	-	-	(114,460,082.62)	(114,460,082.62)
2024.12.31 අවසාන දිනට ශේෂය	15,000,000.00	484,075,000.00	2,996,086,071.26	1,939,361,824.00	5,434,522,895.25

3.6 මුදල් නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

13 වගුව මහින් 2024 වර්ෂයේ කොමිෂන් සභාව වෙත භෞතික සම්පත් අත්පත් කරගැනීම සහ බැහැර කිරීම පිළිබඳ තොරතුරු දක්වා ඇත.

වගුව 13: 2024.12.31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
1.	ඉඩම්	-	403,897,706.29	-	100%
2.	ගොඩනැගිලි	-	97,948,778.99	-	385%
3.	වාහන	-	22,526,224.83	-	20%
4.	ලී බඩු හා කාර්යාල උපකරණ	-	18,925,091.85	-	23%
5.	පිරියත හා යන්ත්‍රෝපකරණ	-	2,738,328.94	-	57%
6.	පරිගණක මෘදුකාංග	-	390,314.53	-	-

4. විගණකාධිපතිවරයාගේ වාර්තාව

A. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ **2024** දෙසැම්බර් **31** වන දිනෙන් අවසන් වර්ෂය වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව (ඇමුණුම 01).

5. කාර්ය සාධන දර්ශක

5.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

වගුව 14 : 2024.12.31 දිනට කාර්ය සාධන දර්ශකය				
අනු අංකය	විශේෂිත දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
		100-90%	75-89%	50-74%
1.	මුදල් ගෙවා මෙතෙක් ඔප්පු නොලැබූ පුද්ගලයින්ට ඔප්පු ලබා දීම.	-	75%	-
2.	පළාත් පාලන ආයතන වලට විකිණීමෙන් ලබාදීම.	131%	-	-
3.	විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන විමසුම් නිකුත් කිරීම.	-	-	73%
4.	ආයතනික විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්	-	-	50%

6. තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

6.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වගුව 15 : 2024.12.31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

අනු අංකය	ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0-49%	50-74%	75-100%
1.	සියළු ආකාරයේ දිළිඳු බව, සියළු තැන්හිම දුරු කිරීම. - නිවාස අරමුණු සඳහා ඉඩම් ඔප්පු ලබාදීම.	6000	4505	-	-	75%
1.	කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණයක් අත්පත් කරගැනීම සහ තිරසාර කෘෂිකර්ම ප්‍රවර්ධනය කිරීම. - කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ලබාදීම (අක්කර) - ඖෂධ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම (අක්කර)	1500 100	88 100	6% 10%	- -	- -
2.	දරාගත හැකි, අන්තර්ග්‍රහණීය සහ තිරසාර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායී රැකියාවත් හා සැමට ගෞරවාන්විත වෘත්තියක් ලැබීම ප්‍රවර්ධනය කිරීම. - පුහුණු වැඩසටහන් පැවැත්වීම.	24	07	29%	-	-
2.	ප්‍රත්‍යස්ථ වූ යටිතල පහසුකම් තැනීම, අන්තර්ග්‍රහණය හා තිරසාර කාර්මිකරණයක් ප්‍රවර්ධනය, නවෝත්පාදන ධෛර්මත් කිරීම. - කර්මාන්ත අමාත්‍යාංශ ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම.	50	09	18%	-	-

7. මානව සම්පත් පැතිකඩ

7.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

වගුව 16 : කාර්ය මණ්ඩල සංයුතිය			
	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	39	40	01
තෘතියික	03	02	(01)
ද්විතියික	289	365	76
ප්‍රාථමික	61	64	03

7.2 මානව සම්පත් සංවර්ධනය

වගුව 17 : පුහුණු කිරීමේ වැඩසටහන්						
වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශිය/ විදේශිය)	නිමැවුම
			දේශිය	විදේශිය		
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කාර්ය සංග්‍රහය	60	දින 01	118,950	-	දේශිය	කොමිෂන් සභාවේ කාර්ය පරිපාටි ක්‍රියාත්මක වීම සම්බන්ධව හා එකී ක්‍රියාපරිපාටි විධිමත් පරිදි ලේඛනගත කොට පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් දැනුවත් වීම හා ඒ අනුව කාර්ය සංග්‍රහය සකස් කරන ආකාරය පිළිබඳව දැනුවත් වීම.
නිවාඩු ලිපිකරුගේ කාර්යභාරය හා වගකීම	01	දින 02	13,000	-	දේශිය	ආයතන සංග්‍රහය අනුව නිවාඩු ලබා ගැනීම සම්බන්ධයෙන් කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව දැනුවත් වීම.
AAT Sri Lanka	01	දින 01	45,000	-	දේශිය	ශ්‍රී ලංකාවේ පවතින බදු ක්‍රමයන් හා ඒවා ගණනය කරන ආකාරය පිළිබඳ දැනුමක් ලබාගැනීම.
රාජ්‍ය ආයතනවල අවසාන ගිණුම් පිළියෙල කිරීම සඳහා බලපාන මූලික ගිණුම්කරණ සංකල්ප හා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වූ දෛනික පුහුණු වැඩමුළුව	06	දින 02	78,000	-	දේශිය	මූලික ගිණුම්කරණ සංකල්ප හා ප්‍රමිත පිළිබඳ දැනුමක් ලබා ගැනීම.
සරප්/මුදල් අයකැමි තනතුරේ කාර්යභාරය හා වගකීම සම්බන්ධව	02	දින 01	14,000	-	දේශිය	සරප් නිලධාරි ලෙස සිදුකල යුතු කාර්යභාරය පිළිබඳව දැනුමක් ලබා ගැනීම.
මත්ද්‍රව්‍ය නිවාරණ වැඩමුළුව	80	දින 02	280,622	-	දේශිය	මත්ද්‍රව්‍ය වලින් වැළකී සිටීම පිළිබඳව දැනුවත් වීම.
මූලික විමර්ශන වැඩමුළුව	04	දින 01	20,000	-	දේශිය	මූලික විමර්ශන කටයුතු සිදුකරන ආකාරය පිළිබඳව දැනුමක් ලබාගැනීම.

8. අනුකූලතා වාර්තාව

වගුව 18 : අනුකූලතා වාර්තාව				
අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
2.	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම. (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙනද යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.6	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.8	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම. (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරින් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම.**			
4.1	වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (PED) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		

6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7.	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල නොවේ		2024 වර්ෂයේ මැතිවරණය පැවැත්වීමත්, කොමිෂන් සභාවේ හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය ඉවත්වීමත් හේතුවෙන් අවසන් කාර්තු 02 හි කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වීම.
8.	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ.		එක් වාහනයක් ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව අළුත්වැඩියා කිරීමට කටයුතු කරමින් සිටියද යාන්ත්‍රික ඉංජිනේරු විසින් ලබා දුන් නිර්දේශය අනුව, එය අළුත්වැඩියා කිරීම සුදුසු නොවන බව හා විධිමත් වෙන්දේසියකින් ඉවත් කිරීම සුදුසු බව නිර්දේශ කරන ඇත. මුදල් රෙගුලාසි 770(4) අනුව විශේෂ සමීක්ෂණ

				මණ්ඩලයක් වෙතින් රථය අපහරණය කලයුතු බව හඳුනා ගැනීමෙන් අනතුරුව රථයේ වර්තමාන තක්සේරුව ලබාගැනීම සඳහා තක්සේරු කමිටුව පත්කර අදාළ ඉදිරි කටයුතු සිදුකරමින් ඇත.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
11.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ		
11.2	හිඟවීම් ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ		
11.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
12	**ආදායම් ගිණුම**			
12.1	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
13	**මානව සම්පත් කළමනාකරණය**			
13.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල නොවේ		මේ සම්බන්ධව අමප/24/0689/615/013 හා 2024.06.13 දිනැතිව අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී ඇති අතර, ඒ සඳහා කොමිෂන් සභා තීරණයක් ද ගෙන ඇත. ඒ අනුව, කාර්යය මණ්ඩලය අනුමත කාර්යය මණ්ඩලය වෙත ඇතුළත් කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට අදාළව කටයුතු සිදුකරමින් පවතී.
13.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		

13.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
14	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
14.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
14.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්තිය ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
15	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
15.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
15.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		

15.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් ගකඅත්සන් කර තිබීම.	අනුකූල වේ		
15.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයේ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ		
16	**විගණන ජේද වලට ප්‍රතිචාර දැක්වීම.**			
16.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ජේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.		විගණන ජේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු සැලකිය යුතු ප්‍රමාණයක් නිවැරදි කොට ඇති අතර, ඉතිරිය නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.	

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ARI/G/LRC/FA/01/2024/26 ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2025 ජූනි 30 දින

සභාපති

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ,1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 40 ඡේදය අනුව වත්කමක් ප්‍රත්‍යාගණනයේ දී අදාළ වත්කම් කාණ්ඩයම ප්‍රත්‍යාගණනය කළ යුත් වුවද ඊට පටහැනිව කරන්දෙණිය පිහිටි ගොඩනැගිල්ල සහ ලිදුල සංචාරක බංගලාව ප්‍රත්‍යාගණනය නොකර ඉතිරි ගොඩනැගිලි පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(4)

(ආ) ප්‍රත්‍යාගණනයට පෙර රු. 14,804,400 ක්වූ ගොඩනැඟිලි රු.17,900,000 ක වටිනාකමට ප්‍රත්‍යාගණනය කර, මුළු ප්‍රත්‍යාගණිත වටිනාකම ගිණුම්ගත කර ඇතත් පෙර වටිනාකම වූ රු. 14,800,400 ගිණුමෙන් ඉවත් නොකිරීම නිසා ගොඩනැඟිලිවල පිරිවැය එම පෙර වටිනාකමින් ද , ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැඟිලිවලට අදාලව ප්‍රත්‍යාගණිත අතිරික්තයට බැර කළ යුතු මුදල රු.7,161,122 ක් වුවත් රු.17,900,000 ක් බැර කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය රු.10,738,876 කින් ද අධිගණනය වී තිබුණි.තව ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 90 ඡේදය අනුව දේපළ පිරියත හා උපකරණ පන්තියක් ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇති විට හෙළිදරව් කල යුතු කරුණු හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ගොඩනැඟිලිවල වාර්ෂික ක්ෂය ගිණුම්ගත කිරීමේ දී රු.2,703,876 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩු වී සමුච්චිත ක්ෂය එම වටිනාකමින් වැඩි වී තිබුණි.

(ඈ) 1972 වර්ෂයේ කොමිෂන් සභාව පිහිට වූ දින සිට අත්පත් කරගත් ඉඩම් බැහැර කිරීමෙන් තවදුරටත් සභාව සතුව පවතින බවට හඳුනාගත් ඉඩම් ප්‍රමාණය ඉඩම් ලේඛණයට අනුව(බදුදී ඇති ඉඩම් හෙක්ටයාර් 4,833 ක් ඇතුළත්ව) හෙක්ටයාර් 279,208 ක් වුවත් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හෙක්ටයාර් 2,144 ක් පමණක් තක්සේරු කර එහි වටිනාකම ලෙස රු.905,285,000 ක් මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් විකුණුම් අත්තිකාරම් ලෙස ලබාගත් රු.1,460,000 ක් විකුණුම් ආදායම තුළ ඇතුළත් කර ඇති බැවින් එම වටිනාකමින් විකුණුම් ආදායම අධිගණනය වී තිබුණි

(ඊ) 2022 හා 2023 වර්ෂ දෙකට අදාලව මුහමලෙයි තෝට්ටම් ඉඩම් බදුදීම් සඳහා ලැබුණු රු.660,000 ක බදු මුදල සමාලෝචිත වර්ෂයේ බදුකුලී ආදායම ලෙස ගිණුම්ගත කර තිබූ බැවින් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ බදුකුලී ආදායම අධිගණනය වී තිබුණි

(උ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කළුගල් බදු, ඉඩම් බදු, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් විධිමත් ගිවිසුම් වලට එළඹ නොතිබීමත් දීර්ඝ කාලීනව අය නොවී පවතින ශේෂ පැවතීමත්, ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීමත් හා රු.466,314,236 ක් වටිනා ලැබිය යුතු ශේෂ 54 ක සහ රු.7,105,291 ක් වටිනා ගෙවිය යුතු ශේෂ 17 කට අදාල ශේෂ සනාතන නොලැබීමත් හේතුවෙන් එම ශේෂයන්හි නිරවද්‍යතාව විගණනයට තහවුරු කර ගත නොහැකි විය.

(ඌ) 1972 අංක 01 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ප්‍රකාරව වතු සමාගම් වලින් හා පුද්ගලයින්ගෙන් පවරාගත් ඉඩම් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල 2024 දෙසැම්බර් 31 දිනට රු. 215,488,388 ක් වූ අතර ඒ සඳහා ඉදිරිපත් කල උපලේඛන දෙකෙහි (අදියර I හා II) වන්දි ගෙවීම් සම්බන්ධයෙන් පිළිගත හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ශේෂයේ නිර්වද්‍යතාව තහවුරු කර ගත නොහැකි විය.

(ඵ) රාජ්‍ය ආයතන 05 කින් ලැබිය යුතු වර්ෂ 20 හා 30 ඉක්මවූ එකතුව රු.2,134,923,858 ක ශේෂයන්ට අදාළව එම ආයතන වලින් කොමිෂන් සභාවට ගෙවීමට කිසිදු ශේෂයක් නොමැති බවත් දන්වා තිබුණි. එම ශේෂයන් අයවිය යුතු බව සනාථ කිරීමට ලිපි ලේඛන කොමිෂන් සභාව සතුව නොතිබීම හේතුවෙන් අයකර ගැනීම අවිනිශ්චිත වූ අතර ඒ සඳහා වෙන් කිරීම කර නොතිබුණ බැවින් අදාල ශේෂයේ නිරවද්‍යතාව තහවුරු කර ගත නොහැකි විය.

(ඒ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.3,600,705,896 ක් වන අතර ඒ තුල අවුරුදු 5 ට වැඩි , 10 ට වැඩි හා අවුරුදු 20 ට වැඩි ශේෂයන් පිළිවෙලින් රු.307,034,880 ක්, රු.161,394,692ක් හා රු.2,346,279,038 ක් විය. අයකර ගැනීම අවිනිශ්චිත වූ එම දීර්ඝකාලීන රු. 2,814,708,610ක ශේෂ සඳහා 1988 වර්ෂයේ සිදු කරන ලද රු. 8,270,355 ක වෙන්කිරීමක් හැර කිසිදු වෙන් කිරීමක් මේ දක්වා සිදුකර නොතිබුණි.

(ඔ) කොමිෂන් සභාව විසින් පොල් වගා කිරීමේ මණ්ඩලයට බදු දුන් ඉඩම් අක්කර 812 රූඩ් 2 පර්චස් 22 කට අදාලව අයවිය යුතු රු.31,688,608 ක් වූ පරිහරණ ගාස්තු හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 කොමිෂන් සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සභාවේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ.මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ,එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ.මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා සභාව තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ 1.2 (ඊ), (ඔ), (ක) යන ඡේදවල දැක්වෙන නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාවේ සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති රීති විධානයට යොමුව	අනුකූල නොවීම
(අ)	1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 44 (ඔ) වගන්තිය	වගන්තියට පටහැනිව කොමිෂන් සභාව විසින් සේවයෙහි යොදවා ගෙන සිටින තැනැත්තන් සඳහා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම හා සුභසාධන හා විනෝද ක්‍රීඩා පහසුකම් සහ නිවාස හා නේවාසිකාගාර හා වෙනත් ඉඩකඩ සැපයීම සිදුකල යුතුය යන්න පදනම්ව කොමිෂන් සභාවේ වසර 5ක අඛණ්ඩ සේවයක් හිමි සේවකයෙකු හට පර්චස් එකක් රු.1,000 ක වටිනාකමට පර්චස් 20 බැගින් ලබා දීමට අදාළව විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිලධාරින් 395 ක් වෙත ඉඩම් අක්කර 49 පර්චස් 35.64 ක් ලබා දී තිබුණි. ඉදිරියේදී ඉඩම් ලබා දීමේ අරමුණින් කොමිෂන් සභාවේ සේවකයින් 120 දෙනෙකුගෙන් රු.10,000 බැගින් රු.1,200,000 ක් වටිනා අත්තිකාරම් මුදලක් ද ලබාගෙන තිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 1.1 ඡේදය	රාජ්‍ය සේවයේ තනතුරක් දරන යම් නිලධාරියෙක් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරක සේවය භාරගැනීම සඳහා තමා දරන තනතුරෙන් මුදවා ගත යුතු වුවද, නිලධාරියකු 2020 ඔක්තෝම්බර් 23 දින සිට 2022 මාර්තු 31 දින දක්වා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරේ සේවය කරමින් සිටියදී, 2021 ජනවාරි 01 දින සිට මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි

(පාලන) තනතුර සඳහා වසරක පරිවාස කාලයකට යටත්ව ස්ථිර පදනම මත සේවයට බැඳී තිබුණු අතර එකම කාලය තුළ ආයතන 02 න්ම ම වැටුප් හා දීමනා ලබාගෙන තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව විසින් අදාළ නිලධාරියාගේ පැමිණීම සහ ලබාදෙන සේවය පිළිබඳව සැලකිලිමත් නොවී වැටුප් හා දීමනා ලෙස 2020 ඔක්තෝබර් සිට 2022 මාර්තු දක්වා රු.2,038,979 ක මුදලක් ගෙවා තිබුණු අතර එම මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ෆ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) මූල්‍ය ප්‍රකාශන වල විවිධ ණයගැතියන් යටතේ පෙන්නුම් කරන කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකෙහි පිහිටි ඉඩම් කැබලි 08 ක් බදුගත් පුද්ගලයින්ගෙන් අයවිය යුතු රු.2,311,017 ක් වර්ෂ 25 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණද,අදාළ බදු මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් විකුණුම් අත්තිකාරම් ශේෂය වූ රු.11,322,992 ක් තුල වර්ෂ 12 කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.11,202,992 ක ශේෂයක් ඇතුළත්ව ඇති අතර එම විකුණුම් අත්තිකාරම් ශේෂයට අදාල ඉඩම් හඳුනාගෙන නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.14,080,850 ක් වූ ඉඩම් බදුකුලී අත්තිකාරම් ගිණුම් ශේෂයේ ඇතුළත් පුද්ගලයින් 269 දෙනෙකුගෙන් ලබාගත් රු.11,215,850 ක අත්තිකාරම් මුදල් වර්ෂ 19 කට වැඩි කාලයක සිට රඳවාගෙන තිබුණ ද, අදාළ ඉඩම් නීත්‍යානුකූලව බදු දීමට හෝ අත්තිකාරම් නැවත පියවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන හි වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ තුල ඇතුලත් වූ නෛතික ලියවිලි මුද්දර ගාස්තු අත්තිකාරම් මුදල වූ රු.6,582,904 ක ශේෂය වසර 03 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින බව නිරීක්ෂණය විය.

(ඔ) උරුමය ඔප්පු ප්‍රදානෝත්සවයට සමගාමීව 'සැමට හිමි බිමක්' ඔප්පු ප්‍රධානෝත්සවය 2024 මාර්තු 30 දින මහනුවර බෝගම්බර ක්‍රීඩාංගනයේදී පවත්වා එහිදී ඔප්පු 2,700 ක් පමණ බෙදා දී තිබූ අතර ඒ සඳහා රු.10,106,158 ක වියදමක් දරා තිබුණි.

(ඊ) 2023 අප්‍රේල් 26 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාව විසින් දෙන ලද නිර්දේශ වන කොමිෂන් සභාව සතු ඉඩම් හා ඉඩම් වල මායිම් හඳුනා ගැනීම, මේ වන තෙක් බැහැර කර ඇති සමස්ථ ඉඩම් වල විස්තර ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කිරීම, අනවසරකරුවන් නියමානුකූල කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ ඔප්පු ලබා දීම මාස 06 ක් ඇතුළත අවසන් කිරීම, පැරණි ණයගැති ශේෂ ඉවත් කිරීම සම්බන්ධයෙන් ප්‍රගතිය ඉදිරිපත් කිරීම, ලිපිගොනු ස්කෑන් කර කල් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් යොදා ගනිමින් සුවිශේෂී කඩිනම් කිරීමේ ව්‍යාපෘති දියත් කිරීම, ඉඩම් වල ආදායම් නිශ්චිතව හඳුනා ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම ,කළුගල් කැඩෙන ප්‍රමාණය මැන බැලීමේ ක්‍රමවේදයක් සකස් කිරීම, බදු ගිවිසුම් නොතිබීම හා බදු ලෙජර සකස් කිරීමේ වැනි අක්‍රමිකතා සිදුවීම සම්බන්ධයෙන් වගකිව නිලධාරීන් හඳුනාගෙන ඔවුන් සම්බන්ධ විනය ක්‍රියාමාර්ග ගැනීම හා පසු විපරම් කිරීම හා කාබනික පොහොර ව්‍යාපෘතිය විමර්ශනයක් සිදුකිරීම හා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම යන කරුණු සම්බන්ධයෙන් ලබාදී තිබූ නිර්දේශ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

(උ) කොමිෂන් සභාව විසින් පවරා ගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීමේ අරමුණින් ඉඩම් බැහැර කිරීමෙන් ලැබෙන ආදායම, ඉඩම් විකුණුම් ආදායම හා කුඹුරු ඉඩම් විකුණුම් ආදායමින් විධිමත් අනුමැතියකින් තොරව සියයට 40 ක් බැගින් වාර්ෂිකව වෙන් කර සංචිතයක් ඇතිකර පවත්වාගෙන ගිය අතර එම සංචිතයේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2,474 ක් වුවත් එම සංචිතය ඇති කල අරමුණින් බැහැරව වරින් වර රු. මිලියන 2535 කට ආසන්න මුදලක් වැය කර තිබුණි.

(ඌ) කොමිෂන් සභාවේ කෘෂිකාර්මික ඉඩම් පැවරීම, ආයෝජන සඳහා ඉඩම් පැවරීම හා ව්‍යවස්ථාපිත නිශ්චය සඳහා ඉඩම් පැවරීම යන අරමුණු ඉටුකර ගැනීම සඳහා 2018 ජූනි 27 දිනැති අංක අමප/18/1126/829/002 දරන කැබිනට් තීරණය මගින් වර්ෂයක කාලයක් සඳහා නිලධාරීන් 214 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඔවුන්ගේ කාර්ය සාධනය අනුව වසර 3ක කාලයක් සඳහා එම නිලධාරීන්ගේ සේවය දීර්ඝ කළ හැකි බව එහි දක්වා තිබුණි. ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය ලෙස ජ්‍යෙෂ්ඨ කළමනාකරණ 11ක්, මධ්‍යම කළමනාකරණ 09 ක්, කනිෂ්ඨ කළමනාකරණ 21 ක්, කළමනාකරණ සහකාර 153 ක්, කාර්යාල සහායක 10 ක් සහ රියදුරු 10 ක් බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණ ද ඊට පටහැනිව කළමනාකරණ සහකාර 12 ක් හා කාර්යාල සහයක 08 දෙනෙකු වැඩිපුර බඳවා ගෙන තිබුණි. තව ද එම අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමකින් තොරව අදාළ වසර 3 අවසන් වීමෙන් පසුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව කළමනාකරණ සහකාර 138 ක්,රියදුරු 10ක් ,කාර්යාල සහයක 16 ක් සඳහා ස්ථිර පත්වීම් ලබාදී තිබුණි.

(එ) 2018 ජූනි 27 දිනැති අංක අමප/18/1126/829/002 දරන කැබිනට් තීරණය මගින් බඳවා ගත් නිලධාරීන් 16 දෙනෙකු වෙත බඳවා ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබිය දී කළමනාකරණ

(1)

සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව ස්ථිර පත්වීම් ලබාදී පර්චස් එකක් රු.1,000 ක වටිනාකමට පර්චස් 20 බැගින් ඉඩම් ද ලබාදී තිබුණි.තව ද ඉන් එක් අයෙකු 2025 පෙබරවාරි මස කොමිෂන් සභාවේ සේවය අතහැර ගොස් තිබුණි.

(ඒ) 2021 මාර්තු 26 දිනැති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පත්‍රිකා අංක 11384 අනුව කළමණාකාර සහකාර තනතුරු 34 ක් හා ප්‍රාථමික තනතුරු 04 ක් සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවාගෙන ඇතත් ඒ සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගෙන නොතිබුණි.

ජී.එච්.ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)